අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

2017

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report



රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
State Printing Corporation

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
STATE PRINTING CORPORATION

වාර්ෂික වාර්තාව,
ගිණුම් ප්‍රකාශන
සහ
විගණකාධිපතිගේ වාර්තාව



2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ 50 වෙනි වසර සඳහා

2017 ජනවාරි මස 01 වෙනි දින සිට
2017 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව


දැක්ම
මුද්‍රණ කර්මාන්තයේ
ප්‍රමුඛයාවීම සමගින්
ප්‍රකාශනයෙන් විශේෂයෙන්
අධ්‍යාපන සංවර්ධන
ප්‍රකාශනයෙන්,
සුරක්ෂා මුද්‍රණ කර්මාන්තය,
අභ්‍යාස පොත් හා ලිපිද්‍රව්‍ය
නිෂ්පාදන වෙළඳපොළේ
පුරෝගාමියා වීම.
මෙහෙවර
දක්ෂ, නිපුණ, ධෛර්යමත්
හා නෘජුතිමත්
සේවක මණ්ඩලයකින් සමන්විත
ආදර්ශමත් රාජ්‍ය සංස්ථාවක්
ලෙස මුද්‍රණ කර්මාන්තයේ
උසස්ම ප්‍රමිතියට අනුව
තරඟකාරී මිලකට
මුද්‍රිත නිෂ්පාදන
ජනතාවගේ අවශ්‍යතාවය හා
උන්නතිය සඳහා
සැපයීමට කැපවෙනු ඇත.

පානළුව,
පාදුක්ක.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුද්‍රණ පනතේ 14 වෙනි වගන්තියේ කොන්දේසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය කෙරෙන,

01. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව

02. ගණන් පරීක්ෂණයට භාජනය කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශය ඇතුළු මූල්‍ය ප්‍රකාශන

03. විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී
සිංහ බිනර ජයවර්ධන
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

සභාපතිතුමාගේ පණිවුඩය



1968 වර්ෂයේ ඇරඹී රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව මේ වන විට තම 50 වන ජයග්‍රාහී කඩඉම පසුකිරීමට සූදානමින් සිටින මොහොතක එහි අභිනව සභාපතිවරයා ලෙස පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ජීවිතයේ ලද භාග්‍යයක් සේ සලකමි.

පාසල් පෙළපොත අඩුපාඩුවකින් තොරව නොපමාව ශ්‍රී ලාංකීය සිසු පරපුරට ලබා දීමේ අරමුණු පෙරදැරිව 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා පනතින් ආරම්භ කළ මෙම ආයතනය වර්තමානයේ පාසල් පෙළපොතට අමතරව සෘජු වෙළඳ නාමය යටතේ පාසල් දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් මුද්‍රණය හා ප්‍රකාශන කටයුතුවල ප්‍රකට නමක් දිනා ඇත.

පසුගිය කැබිනට් සංශෝධනය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාලනයට නතු වූ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව පාසල් පද්ධතිය සමඟ සම්බන්ධ කර ගනිමින් ඉදිරියට මෙහෙය වීම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආශීර්වාදය මත, අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතාගේ පූර්ණ මඟ පෙන්වීම යටතේ සිදු කිරීම මගේ ඒකායන බලාපොරොත්තුවයි.

එසේම රහස්‍ය මුද්‍රණ අංශය මගින් සහ අනෙකුත් මුද්‍රණ කටයුතුවලින් ආයතනයට ලැබෙන කීර්තිය සුළුපටු එකක් නොවේ. එම කීර්තිය තවදුරටත් වර්ධනය කරගනිමින් රාජ්‍ය ආයතනයක් ලෙස සමාජ සුභසාධනය වෙනුවෙන් කැපවීමත්, ලාභ ලබා ගනිමින් රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කිරීමත් යන කරුණු දෙකම ඉදිරි වසර කිහිපය තුළ ළඟා කර ගැනීම සභාපතිවරයා ලෙස මගේ ප්‍රමුඛතම වගකීම ලෙස මා විශ්වාස කරමි.

එසේම ආයතනයේ සුබ සිද්ධිය ගොඩනැගීමට නම් ආයතනයේ කාර්යක්ෂමතාවය වැඩිකළ යුතු බව මගේ විශ්වාසයයි. ඒ වෙනුවෙන් සියලු සේවකයන් සමඟ එක්ව ඉදිරියට යාමටත්, කලක ආසියාවේ මුද්‍රණ දැවැන්තයා ලෙස ලබා තිබූ ගෞරවය යළි ලබා ගැනීමටත් මම බලාපොරොත්තු වෙමි.

ඔබ සැමට යහපත් හෙට දවසක් !

සිංහ බිනර ජයවර්ධන
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2017
අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති

රවීන්ද්‍ර යසලාල් කලන්සූරිය මහතා (2017 ජූනි දක්වා)

චන්ද්‍රසිරි ලොකුගේ මහතා (2017. 06. 29 - 2017. 12. 15)

එස්. ආලෝක බණ්ඩාර මහතා (2017. 12. 18 - 2018. 05. 24)

ක්‍රියාකාරී අධ්‍යක්ෂ

නැණසේන ආදිහෙට්ටි මහතා
බන්දුල ඩයස් මහතා (2017. 06. 29 සිට)

අධ්‍යක්ෂ

1. ඩබ්ලිව්. කේ. ඩී. ඩන්ස්ටන් මහත්මිය
2. ඩබ්ලිව්. ඒ. ඩී. එස්. ගුණසිංහ මහතා
3. ජී. එම්. නීල් ගුණදාස මහතා
4. බන්දුල ගුරුසිංහ මහතා
5. දර්ශන පොන්නම්පෙරුම මහතා
6. එම්. එම්. පී. කේ. මීගහකොටුව මිය

අමාත්‍යාංශ විෂය පථය වෙනස් වීමත් සමග
අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වෙනස් විය.

1. ඊ. එම්. නාලිකා එදිරිසිංහ මහත්මිය
2. රෝහණ චමින්ද රත්නායක මහතා
3. නහිල් හපුආරච්චි මහතා

2017

විධායක නිලධාරී මණ්ඩලය

සාමාන්‍යාධිකාරී
ආර්. එම්. එන්. මොණරවිල මහතා

මුදල් කළමනාකරු
එන්. ඩී. ප්‍රියංකර කුමාර මහතා

වැඩ කළමනාකරු
එස්. ටී. කරුණාරත්න මහතා

සැපයුම් කළමනාකරු
ඊ. වී. කේ. කීර්තිරත්න මහතා

කළමනාකරු (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)
ආර්. එම්. යූ. ඩී. බණ්ඩාර මහතා

අලෙවි කළමනාකරු
එම්. ටී. ජේ. පෙරේරා මහතා

නියෝජ්‍ය වැඩ කළමනාකරු
ඩී. එම්. එම්. බී. දිසානායක මහතා

නියෝජ්‍ය වැඩ කළමනාකරු
ටී. එම්. ආර්. එන්. තෙන්නකෝන් මහතා

නියෝජ්‍ය මුදල් කළමනාකරු
කේ. එච්. තිලකරත්න මහතා

කළමනාකරු (ලිපි ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව)
එල්. ටී. ප්‍රේමසිරි මහතා

ගණකාධිකාරි
එම්. ආර්. පී. ජයවර්ධන මහතා

ගණකාධිකාරි
ඩබ්. එල්. දෙනියගේ මහතා

අභ්‍යන්තර විගණක
එම්. එස්. එස්. මොහොට්ටි මහතා

සහකාර කළමනාකරු වැඩ (ඇස්තමේන්තු)
කේ. ඩී. ටී. චන්ද්‍රසිරි මහතා

සහකාර කළමනාකරු වැඩ (සුරක්ෂා)
එම්. ඒ. කොතලාවල මහතා

සහකාර කළමනාකරු වැඩ (ප්‍රොසෙස්)
එස්. ඩී. කුමාරසිංහ මහතා

සහකාර කළමනාකරු වැඩ (පොත් බැඳීම්)
එම්. ඒ. ශාන්ත කුමාර මහතා

සහකාර කළමනාකරු වැඩ (ලිතෝ)
පී. කේ. තිලක් මහින්ද මහතා

සහකාර කළමනාකරු (විකුණුම්)
එච්. ආර්. ගුණසේකර මහතා

සහකාර කළමනාකරු (ආරක්ෂක)
ඩබ්. ඩබ්. එම්. ආරච්චිගේ මහතා

සහකාර කළමනාකරු
(පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)
කේ. එච්. බී. සජීව මහතා

සහකාර කළමනාකරු
(නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)
ඒ. එල්. ආර්. මධුකානි මහත්මිය

සහකාර කළමනාකරු (ප්‍රකාශන)
මධුරංග සී. නුවන්ප්‍රිය මහතා

සහකාර කළමනාකරු (සැපයුම්)
යූ. අනිල් ජයකාන්ත මහතා

ගණකාධිකාරි
ඩබ්. ඒ. ඒ. එස්. ජයසුන්දර මහතා

සහකාර කළමනාකරු වැඩ (නඩත්තු)
එන්. ජී. එල්. චන්දිමාල් මහතා

2017 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1971 අංක 38 දරන මුද්‍රිත් පනතේ 14 වන වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ඇතුළත් සිය 49 වෙනි වාර්තාව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් මෙසේ ඉදිරිපත් කරයි.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වන ලදී.

01. නිෂ්පාදනය

1.1 පාසල් පෙළ පොත්

1.1.1 පාසල් පෙළ පොත් මුද්‍රණය

පාසල් පෙළ පොත් මුද්‍රණය මූලික අරමුණ කර ගනිමින් පිහිටුවනු ලැබූ සංස්ථාව විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමගම වෙනත් නිෂ්පාදන අංශ කරා යොමුවී ඇත. ඒ සමගම පාසල් පොත් මුද්‍රණය සෘජුව සංස්ථාව වෙත පැවරීම වෙනුවට ටෙන්ඩර් මගින් තරගකාරීව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ඇණවුම් ලබා ගැනීමට සංස්ථාවට සිදුවිය. එහෙත් එම ක්‍රමය වෙනස් කරමින් 2017 වර්ෂයේදී ද ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව පෙළ පොත් මුද්‍රණය සංස්ථාවට පැවරීමට කැබිනට් අනුමැතිය ලැබිණි. ඒ අනුව 2017 වසරේ දී ද පාසල් පෙළ පොත් පිටපත් මිලියන 7.981 ක් මුද්‍රණය කර දෙමින් සංස්ථාවට රුපියල් මිලියන 676.391 ක ආදායමක් ලැබුණි.



සමාලෝචිත වර්ෂයේ මුද්‍රණය කළ පාසල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව හා ඉන් ලද ආදායම 2015 හා 2016 ට සාපේක්ෂව පහත දැක්වේ.

පාසල් මුද්‍රණ වැඩ	2015 ('000)	2016 ('000)	2017 ('000)
පිටපත් සංඛ්‍යාව	9,110	10,984	7,981
ආදායම - රු.	735,111	855,865	676,391



1.2 වෙනත් මුද්‍රණ සේවා

සමාලෝචිත වර්ෂය තුළදී දහම් පාසල් පොත් මුද්‍රණය, ආරක්ෂිත මුද්‍රණ සේවා (ලොතරැයිපත්, රිදී රේඛා, බැංකු තැන්පත් සහතික පත්, තැපැල් පාස්පොත්, ලේබල්, එයාපෝර්ට් සුපර් ඩ්‍රෝ යනාදිය) සහ රාජ්‍ය ආයතන සඳහා මුද්‍රණ සේවා සපයන ලදී. එමෙන්ම විවිධ ආයතන සඳහා දිනපොත්, කැලැන්ඩර් යනාදිය මුද්‍රණය කරන ලදී. මීට අමතරව විවිධ ආයතනවල මුද්‍රණ කාර්යයන් ද ඉටු කරන ලදී. විශේෂ මුද්‍රණ සේවා කිහිපයක් පහත පරිදි වේ.

1.2.1 සුරක්ෂා මුද්‍රණ සේවා

ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා මහජන සම්පත ලොතරැයිය දැනට වසර 43ක පමණ කාලයක් මුද්‍රණය කරන ලදී. මීට අමතරව එයාපෝර්ට් ලොතරැයිය ද මුද්‍රණය කරනු ලැබේ. ලොතරැයි මණ්ඩලයෙන් ලද සියලුම ඇණවුම් මුද්‍රණය කර දුන් අතර, 2017 වසරේ දී මුද්‍රණය වූ ලොතරැයි ප්‍රමාණය මිලියන 400 කි. ඒ අනුව ආදායම රු. මිලියන 234ක් වී ඇත. ලොතරැයි මුද්‍රණයේ ආදායම හා පිටපත් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.



ලොතරැයි මුද්‍රණ වැඩ	2015 ('000)	2016 ('000)	2017 ('000)
පිටපත් සංඛ්‍යාව	249,918	428,902	399,739
ආදායම - රු.	152,060	245,060	233,947



1.2.2 වෙනත් මුද්‍රණ සේවා

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා මෙන්ම පෞද්ගලික අංශයේ ඇණවුම් ලබා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන ලදි. ඉටු කරන ලද විශේෂ මුද්‍රණ සේවා අතර පහත සඳහන් සේවා ප්‍රධාන තැනක් ගන්නා ලදි.

01. විවිධ ආයතනයන් සඳහා වූ වාර්ෂික වාර්තා
02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා වූ විවිධ මුද්‍රණ වැඩ කටයුතු
03. විශ්වවිද්‍යාල සහතික පත්
04. ජාතික සත්වෝද්‍යානයට අයත් ප්‍රවේශ පත්‍ර හා අනෙකුත් විස්තර පත්‍රිකා
05. සිනමාශාලා ටිකට්පත්
06. සේවක අර්ථසාධක අරමුදලේ විවිධ මුද්‍රණ වැඩ
07. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අයත් මුද්‍රණ කටයුතු
08. විභාග දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරන ලද උත්තර ලියන කඩදාසි පොත්
09. දහම් පාසල් පොත් මුද්‍රණය

සමාලෝචිත වර්ෂයේදී විවිධ මුද්‍රණ වැඩ ඉටු කරමින් සංස්ථාව ලත් ආදායම රු. මිලියන 121 කි.

1.3 අභ්‍යාස පොත් සහ අනෙකුත් පොත් නිෂ්පාදනය

ලිපිද්‍රව්‍ය අංශයේ 2017 වර්ෂයේදී නිෂ්පාදනය කරන ලද අභ්‍යාස පොත්, සී. ආර්. පොත් හා අනෙකුත් පොත් වර්ග සහ ඒවායේ වටිනාකම් පහත පරිදි වේ.

විස්තරය	නිෂ්පාදන ප්‍රමාණය	වටිනාකම (රුපියල්)
අභ්‍යාස පොත් (පිටු 80 පොත් වලින්)	මිලියන 9.541	මිලියන 211,214
සී. ආර්. පොත් (පිටු 80 සී.ආර්. පොත් වලින්)	මිලියන 0.837	මිලියන 40,270
වෙනත් ලිපිද්‍රව්‍ය නිෂ්පාදන (ඒකක වලින්)	මිලියන 0.407	මිලියන 28,196
එකතුව	මිලියන 10.785	මිලියන 279,680

සමාලෝචිත වර්ෂයේදී ලිපිද්‍රව්‍ය අංශයේ නිෂ්පාදනය 2015 හා 2016 වසරවලට සාපේක්ෂව පහත පරිදි වේ.

අභ්‍යාස පොත් හා අනෙකුත් පොත්	2015 ('000)	2016 ('000)	2017 ('000)
පොත් පිටපත් සංඛ්‍යාව	11,147	9,869	10,785
ආදායම - රු.	251,600	233,973	279,680

අපේක්ෂිත පරිදි ජනවාරි මාසය තුළ ලියන කඩදාසි තොග නොමැතිවීම නිසා 2017 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි විය.

2017 වසරේ නිෂ්පාදන ඉලක්කය : මිලියන 13,564
(වටිනාකම රු. මිලියන 320)

අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් සමස්ත පිටපත් සංඛ්‍යාව



අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් සමස්ත ආදායම



02. අලෙවි හා විකුණුම්

2017 වර්ෂයේදී සමස්ත අලෙවි ආදායම සුළු වශයෙන් අඩුවීමක් සිදු වී ඇත.

වර්ෂය	2015 රු.	2016 රු.	2017 රු.
සමස්ත ආදායම (බදු ඇතුළත්)	242,031,775.00	291,513,207.00	-
බදු ශෝධිත ආදායම	-	260,001,891.00	254,824,097.00

2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී අභ්‍යාස පොත් ආදායමෙහි ඇතිකරගත් වර්ධනය තව දුරටත් පවත්වා ගැනීමට 2017 වසරේදී නොහැකි වී ඇති අතර ආදායම් වටිනාකම 5% ක පමණ අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වයට මූලිකම හේතුව වන්නේ 2017 වසර තුළදී කඩින් කඩ ඇති වූ අභ්‍යාස පොත් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමේ හිඟයයි.

කාර්යාල හා පාසල් ලිපිද්‍රව්‍ය විකුණුම් ක්ෂේත්‍රය තුළ සැලකිය යුතු ආදායම් ප්‍රගතියක් පෙන්වා ඇති අතර එම ක්ෂේත්‍රයෙහි වටිනාකම් ප්‍රගතිය පෙර වසරට වඩා 23% ක් පමණ වේ. කෙසේ වෙතත් මෙම ක්ෂේත්‍රය තුළ නැවත විකිණීම සඳහා සිදුකරන මිලදී ගැනීම්වල ඌණතාවය සිදු නොවූයේ නම් මීට වඩා විශාල වර්ධනයක් පෙන්නුම් කළ හැකිව තිබුණි.

සමස්ත අලෙවිය



ප්‍රකාශන සේවා

ප්‍රකාශන ක්ෂේත්‍රය සඳහා පෙර වසරෙහි දී ප්‍රකාශන කළමනාකරුවෙකු බඳවා ගත් අතර ඊට සහායක සේවක අවශ්‍යතාවයද සපයා දී ඇත.

ප්‍රකාශන අංශයේ ආදායම් ඉහළ නැංවීමේ අරමුණෙන් අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ. එයට සමගාමීව නවකතා හා ළමා කතා ප්‍රකාශන ව්‍යාපෘතිය ද ක්‍රියාත්මකය.

මෙම ක්ෂේත්‍රයේ පෙර වසරේ ලැබූ ආදායම් වටිනාකම සැලකීමේදී සමාලෝචිත වර්ෂයේදී 116% ක පමණ වර්ධනයක් පෙන්නුම් කළ ද තවදුරටත් පාඩු ලබමින් පවතින ක්ෂේත්‍රයකි. මෙම තත්ත්වයෙන් අත්මිදීම සඳහා දැනට වඩා ආදායම් ඉහළ නැංවිය හැකි ක්‍රමවේදයන් පිළිබඳව ඉදිරියේදී අවධානය යොමු කළ යුතුව ඇත.

2017 ප්‍රකාශිත නව කෘති ගණන	14
මුද්‍රිත මුළු පිටපත් ගණන	61,340
2016 වර්ෂයේ බදු ශෝධිත ආදායම	රු. 1,120,589
2017 වර්ෂයේ බදු ශෝධිත ආදායම	රු. 2,397,001

03. ස්ථාවර වත්කම්

2017 වර්ෂය අවසානයේදී සංස්ථාව සතු ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය රු. 1,038,999,817/- ක් විය. එහි ශුද්ධ වටිනාකම රු. 993,178,106/- කි. මෙම තත්ත්වය මීට පෙර එනම් 2016 වසර හා සැසඳීමේදී පිළිවෙළින් රු. 423,154,675 ක් හා රු. 147,377,105/- ක් වශයෙන් විය.

ස්ථාවර වත්කම්	2015 රු.('000)	2016 රු.('000)	2017 රු.('000)
ආරම්භක වටිනාකම (පිරිවැයට)	375,101	397,198	765,833
වර්ෂ අවසාන ශුද්ධ වටිනාකම	99,680	147,377	993,178

04. බදු බැඳියාව

සංස්ථාව තක්සේරු වර්ෂ 2017/2018 සඳහා ආදායම් බදු හා ලාභාංශ බදු ලෙස කිසියම් හෝ මුදලක් සංස්ථාවේ 2017 වසරේ අවසාන ගිණුම් අනුව ප්‍රතිපාදනය කොට නොමැත.

බදු බැඳියාව	2015 රු.('000)	2016 රු.('000)	2017 රු.('000)
ආදායම් බදු	821	324	-
ලාභාංශ බදු	-	-	-
එකතුව	821	324	-

05. ලාභය

2017 වසර තුළදී සංස්ථාව රු. 229,273,949/- ක බදු පූර්ව අලාභයක් උපයා ඇති අතර, 2016 වසරේදී රු. 74,649,560/- ක අලාභයක් විය.

ලාභදායිතාව	2015 රු. ('000)	2016 රු.('000)	2017 රු.('000)
බදු පූර්ව ලාභය (අලාභය)	2,932	(74,650)	(229,274)
බදු ප්‍රතිපාදනයෙන් පසු	2,111	(74,974)	(229,274)

2016 වාර්ෂික වාර්තාවේ දක්වන ලද ලාභය හා බදු බැඳියාව 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ අනුව 2017 වර්ෂයේ නැවත ගිණුම් සකස් කිරීමේදී ඉහත ආකාරයට සංශෝධනය වී ඇත.



06. ප්‍රසාද දීමනා

වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් සුදුසුකම් ලැබූ සේවකයින් සඳහා මාස 02 ක වැටුපකට සමාන මුදලක් ගෙවන ලදී. එසේ ගෙවන ලද මුළු ප්‍රසාද දීමනාව රු. 50,190,854/- කි. 2016 වසරට සාපේක්ෂව 6% ක අඩුවීමකි.

ප්‍රසාද දීමනා	2015 රු. ('000)	2016 රු. ('000)	2017 රු. ('000)
	50,660	53,029	50,191



07. සුභ සාධනය

පහත සඳහන් සුභ සාධන සේවා හා පහසුකම් පසුගිය වර්ෂයේ පදනම යටතේ මෙම වසර තුළදී ද පවත්වා ගෙන යන ලදී. මේ වෙනුවෙන් සංස්ථාව වැය කළ මුළු මුදල රුපියල් මිලියන 130.6 ක් විය.

	සුභ සාධනය	2015 රු.('000)	2016 රු.('000)	2017 රු.('000)
01.	සේවක ප්‍රවාහන පහසුකම්	2,595	4,877	11,012
02.	සේවක දිරි දීමනා ගෙවීම්	5,904	6,075	6,022
03.	වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම	6,018	9,655	10,612
04.	සේවක විවිධ සුභ සාධනය	24,659	25,246	24,924
05.	කම්කරු වන්දි ආරක්ෂණය	228	-	-
06.	සියලුම සේවකයින් සඳහා ලිපිද්‍රව්‍ය තැගි වවුචරයක් ප්‍රදානය කිරීම	1,251	1,646	1,685
07.	සේවක ප්‍රසාද දීමනා	50,660	53,029	50,191
08.	සේවක නිවාස ණය ප්‍රතිපූරණය	4,938	4,274	3,114
09.	සේවක ඉතිරි නිවාඩු සඳහා ගෙවීම	16,938	16,409	15,607
10.	විශේෂ දිරි දීමනා	6,700	6,630	7,490
	එකතුව	119,891	127,841	130,657

08. සේවක මණ්ඩලය

2017. 12. 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 715 කි.

සේවක සංඛ්‍යාව	2017
කාර්යාලය	149
ප්‍රධාන මුද්‍රණාලය	357
ලිපිද්‍රව්‍ය කම්හල	45
ආරක්ෂක අංශය	44
අලෙවිසැල්	47
අනියම් හා කොන්ත්‍රාත් සේවකයින්	71
මුළු සේවක සංඛ්‍යාව	**715**

2017 වර්ෂය තුළ දී සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන්

2017 වර්ෂය තුළදී සංස්ථා සේවයෙන් නිලධාරී මට්ටමේ සේවක මහත්ම මහත්මීන් කිසිවකු විශ්‍රාම ගොස් නොමැත.

2017 වර්ෂය තුළ දී සේවයට බඳවාගෙන ඇති නිලධාරීන්

	නම/තනතුර	දිනය
1.	ඩබ්. ඒ. ඒ. එස්. ජයසුන්දර මහතා ගණකාධිකාරී	2017. 01. 02
2.	එන්. ජී. එල්. චන්දිමාල් මහතා සහකාර කළමනාකරු වැඩ (නඩත්තු)	2017. 01. 23

සමාප්තිය

සංස්ථාවේ වැඩ කටයුතු ඉතා සාර්ථක ලෙස කර ගෙන යාම සඳහා ඉතා ලැදිව සහයෝගය දුන් සංස්ථාවේ සියලු සේවකයන්ට සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ. සාර්ථක වැඩ පිළිවෙළක් සඳහා සෑම විටම මග පෙන්වීම කරමින් සහාය ලබාදුන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාටත්, එම වැඩ පිළිවෙළට නිරතුරුව සහයෝගය ලබාදුන් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ.

ඉදිරි වර්ෂය තුළදී ද එවැනිම සහයෝගයක් හා ප්‍රතිචාරයක් සංස්ථාවේ සියලු සේවකයින්ගෙන් පාලනාධිකාරිය බලාපොරොත්තු වන්නේය.

සිංහ බිනර ජයවර්ධන
සභාපති

2017 රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 2017 දෙසැම්බර් 31 වැනිදා වන විට

1. සංස්ථාව පිළිබඳ තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

1968 අංක 24 දරන පාර්ලිමේන්තු පනතට අනුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වසරේදී ස්ථාපනය කෙරිණි. ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය එහි කළමනාකාරීත්වය භාරව ක්‍රියා කරයි.
පාදුක්ක, පානඵව ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ පාසල් පෙළ පොත් මුද්‍රණය, අභ්‍යාස පොත් නිෂ්පාදනය හා වෙනත් මුද්‍රණ කාර්යයන් සිදු කිරීමයි.

1.3 නිකුත් කිරීමට අධිකාරය ලද දිනය

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ 2017.12.31 දිනට මූල්‍ය ප්‍රකාශණ 2018. 02. 27 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කිරීමට අනුමත කරන ලදී.

2. ගිණුම් ප්‍රමිතීන් හා පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ පුළුල් ප්‍රකාශනය, අරමුදල් හා මුදල් ගලා ඒමේ වෙනස්කම් සහ ප්‍රතිපත්ති මෙන්ම සටහන් සකසා ඇත්තේ LKAS සහ SLFRS යන ගිණුම්කරණ ප්‍රමිතීන් හා 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුවය.

2.1 අනුකූලතා ප්‍රකාශය

උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනය සකසා තිබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් එය ඉදිරිපත් කර ඇත.

2.2 ඇගයුම් පදනම

පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර තිබෙන්නේ ඓතිහාසික පිරිවැය පදනම් කර ගෙනය.

* විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් පොලී ආදායම
* ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්

2.3 අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව පවත්වා ගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් සිදු කොට අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත් එය ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා නොකරයි.

2.4 භාවිතාවන ව්‍යවහාර මුදල්

අවසාන ගිණුම් ඉදිරිපත් කර ඇත්තේ සංස්ථාවේ ව්‍යවහාර මුදල් වූ ශ්‍රී ලංකා රුපියල් වලිනි.
සියළුම මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ රුපියල් වලින් වන අතර ආසන්න රුපියලේ අගයට වටිනාකම් දක්වා ඇත.

2.5 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් කලින් අවුරුදු වල අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තීන් නොවෙනස්ව ඒ ආකාරයෙන් අනුගමනය කර ඇත. අවශ්‍ය අවස්ථාවල කලින් අවුරුදුවල වටිනාකම් හා සඳහන් කිරීම් නැවත සකසා ඉදිරිපත් කිරීම් කර ඇත. සංස්ථාව විසින් ඉකුත් වර්ෂවලට අදාල වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්වය නැවත ප්‍රකාශ කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සියළුම කාලපරිච්ඡේදයන් සඳහා ඒකාකාරී ලෙස නොකඩවා සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශණවල ඉදිරිපත් කර ඇත.

3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ සඳහන් කර ඇත්තේ එකතු ක්ෂයවීම් අඩු කරන ලද ශුද්ධ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම වේ.

පහත සඳහන් දිනවල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වත්කම් තක්සේරු කරන ලදී.

ඉඩම් හා ගොඩනැගිලි	-	02.01.2017 සිට 06.01.2017 දක්වා
කාර්යාලයීය උපකරණ, ලී බඩු හා සවිකිරීම් පරිගණක උපාංග	-	02.01.2017 සිට 30.01.2017 දක්වා
යන්ත්‍ර හා පිරියත	-	16.01.2017 සිට 30.01.2017 දක්වා
මෝටර් රථවාහන	-	13.01.2016 සිට 14.01.2016 දක්වා

වත්කම් ප්‍රත්‍යාගණනයේ වෙනස හෝ ලාභය විස්තීරණ ආදායම තුල දක්වා ඇති අතර හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුල ප්‍රත්‍යාගණන සංචිතය නමින් ප්‍රත්‍යාගණන ලාභය දක්වා ඇත.

වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසු කාර්යාලීය උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් එකම පංතියක් ලෙසත් උපකරණ මෙවලම් සහ අත් කරත්ත තවත් පංතියක් ලෙසත් වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

3.1.1 ක්ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීවකාලය පිළිබඳ තක්සේරුවකින් පසු සරල මාර්ග ක්‍රමයට ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.

තක්සේරු කරන ලද වත්මන් හා සංසන්දනාත්මක ඵලදායී ජීවකාලය පහත පරිදි වේ.

ගොඩනැගිලි	වසර 40 යි
පිරියත හා යන්ත්‍රෝපකරණ	වසර 13.33 යි
මෝටර් හා වෙනත් වාහන	වසර 04 යි
ලී බඩු හා සවිකිරීම්	වසර 10 යි
කාර්යාලයීය උපකරණ	වසර 10 යි
පරිගණක හා උපාංග	වසර 03 යි
කර්මාන්තශාලා උපකරණ හා අකුරු	වසර 04 යි

3.2 තොගය

තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන අගයන්ගෙන් අවම අගයට ගණනය කර ඇත.

3.3 බදුකරණය

3.3.1 ආදායම් බදු

අදාල වර්ෂයේ සහ පෙර වර්ෂවලට අදාල ආදායම් බදු බැරකම් හෝ වත්කම් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීමට හෝ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ආදායම් බදු ගණනය කිරීමේදී මූල්‍ය ප්‍රකාශණවල සඳහන් කර ඇති දිනට වලංගු බදු ප්‍රතිශතයන් සහ එදිනට නීතිරීති වලට අනුව කටයුතු කරනු ලැබේ. ආදායම් බදු සඳහා වෙන් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව ඇති ආදායම් සහ වැය ප්‍රභවයන්ට අනුව 2006 වර්ෂයේ දේශීය ආදායම් පනතේ 10 වන ඡේදයට අනුව සහ ඉන් පසුව සිදුකරන ලද සංශෝධනවලට යටත්ව කටයුතු කරනු ඇත.

3.4 මුදල් හා මුදල්වලට සමාන දෑ

අත ඇති මුදල්, මාර්ගස්ථ මුදල් සහ බැංකුවේ ඇති මුදල්, මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ. අරමුදල් ප්‍රධාන ප්‍රකාශණයේදී බැංකු අයිරාව සහ බැංකු ශේෂයට වැඩියෙන් ලබාගත් මුදල් ද මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.

මුදල් හා මුදල්වලට සමාන දෑ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සහ අනෙකුත් ගනුදෙනු සඳහා අධික ද්‍රවසීලතාවයක් ඇති ලෙස සැලකේ.

4. මූල්‍ය උපාංග - මූලික හඳුනාගැනීම් හා ඉදිරි පියවර

4.1 මූල්‍ය වත්කම්

4.1.1 වෙළඳ ණය ගැතියෝ

වෙළඳ ණය ගැතියන් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කර ඇත.

4.2 මූල්‍ය බැඳුම්කර

4.2.1 දේපළ උකස් කිරීම

සියලු බැංකු පහසුකම් බැංකු අයිරා, කෙටිකාලීන ණය, ණය බර ලිපි සහ බැංකු ඇපකර කාලයෙන් කාලයට ලබාගෙන ඇත්තේ මහජන බැංකුවෙන් වන අතර ඒ සඳහා සංස්ථාවේ ඉඩම්, ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍ර බැඳුම්කර අංක එම්. බී. 979/3063/3243/1147/422/5789 මගින් උකසට තබා ඇත.

4.2.2 අසම්භාව්‍ය බැරකම් හා ප්‍රධාන කැප කිරීම්

සංස්ථාවෙන් අස්වූ සේවකයෙකු විසින් කම්කරු විනිශ්චය සභාවේ නඩු අංක 33/1303/2017 යටතේ වන්දි නඩුවක් විභාග වෙමින් පවතී.

ලොතරැයි මුද්‍රණය සඳහා සංස්ථාව වෙත නවතම මුද්‍රණ යන්ත්‍රයක් (Lombardi Synchrolin - 330) 2017. 07. 04 දින මහජන බැංකුවේ ණය පදනම යටතේ ගෙන්වන ලදී. එම යන්ත්‍රය 2017. 12. 31 දිනට මිලියන 179.9ක් ප්‍රාග්ධන ගතකළ අතර මෙතෙක් නිෂ්පාදන කටයුතු සඳහා භාවිත මට්ටමේ නොමැත.

5. විශ්‍රාම පාරිතෝෂිත වගකීම්

5.1 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 පාරිතෝෂික දීමනා පනතට අනුව පාරිතෝෂික දීමනාව ගෙවීමට සංස්ථාව බැඳී සිටින අතර මෙතෙක් නියමිත දිනවලට එම දීමනාව ගෙවා ඇති අතර 2017. 12. 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමට අදාල අරමුදලක් සංස්ථාව විසින් පවත්වාගෙන යනු නොලැබේ.

5.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ නීතිරීති වලට අනුව සංස්ථාව (සේවායෝජක) විසින් සේවාදායකයා වෙත අදාල අරමුදල් සඳහා බැර කිරීමට බැඳී සිටී. සංස්ථාව විසින් 12% ක් සහ 3%ක් සේවාදායකයාගේ දළ වැටුපට අනුව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා භාරකාර අරමුදලට දායකත්වයක් ලබාදෙනු ලැබේ.

6. ආදායම් හා වියදම්

6.1 ආදායම් හඳුනාගැනීම

උපචිත පදනම මත සියලු ආදායම් හඳුනා ගැනේ.

පොළී මගින් ආදායම
සංස්ථා සේවකයන්ට ලබා දෙන ණය සඳහා 10% ක පොලියක් අය කරනු ලැබේ.

6.2 වියදම්

වසරේ ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දැරූ වියදම් සියල්ල ආදායම්වලින් අඩු කර ගෙන තිබේ.

6.3 ණයට ගැනුම් පිරිවැය

ණයට ගැනුම් පිරිවැය ඒවා සිදුවූ කාලය තුල වියදම් ලෙස හඳුනාගැනෙන අතර යන්ත්‍ර හා පිරියත ඒවා ක්‍රියාකාරීත්වයට පත්වන තෙක් දරණ ලද ඊට අදාල පොලී වියදම ප්‍රාග්ධනගත කර ඇත.

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

	සටහන	නැවත ප්‍රකාශිත ගිණුම් 2017 රු.	2016 රු.	2016 රු.
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	15	993,178,106	147,377,104	147,377,105
		993,178,106	**147,377,104**	**147,377,105**
ජංගම වත්කම්				
තොගය	16	252,711,676	224,807,529	248,672,366
වෙළඳ ලැබීම්	17	527,327,575	679,404,249	703,301,233
වෙනත් ලැබීම්	18	47,308,810	212,689,463	212,689,463
පූර්ව ගෙවීම්		1,673,445	263,539	263,539
මුදල් හා මුදල්වලට සමාන දෑ	19	51,857,886	39,830,161	39,830,161
මුළු ජංගම වත්කම්		**880,879,392**	**1,156,994,941**	**1,204,756,762**
මුළු වත්කම්		**1,874,057,497**	**1,304,372,045**	**1,352,133,867**
ස්කන්ධය හා බැරකම්				
ප්‍රාග්ධන නිකුතුව		15,000,000	15,000,000	15,000,000
සංචිත		15,003,633	15,003,633	15,003,633
රඳවා ගත් ඉපයීම්		(30,931,579)	195,331,388	239,737,480
එකතු කලා: ප්‍රත්‍යාගණන ලාභ		701,192,812	36,015,363	36,015,363
මුළු ස්කන්ධය		**700,264,866**	**261,350,384**	**305,756,476**
ජංගම නොවන බැරකම්				
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්		188,712,450	185,196,612	185,196,613
විලම්බිත බදු වගකීම්	20	(11,268,578)	-	-
එකතුව - ජංගම නොවන බැරකම්		**177,443,872**	**185,196,612**	**185,196,613**
ජංගම බැරකම්				
වෙළඳ ගෙවීම්	21	171,530,729	208,220,612	211,576,342
වෙනත් ගෙවීම්	22	42,641,788	44,761,093	44,761,093
කෙටි කාලීන ණය	23	745,962,105	569,351,346	569,351,346
බැංකු අයිරා		36,214,137	35,491,997	35,491,997
මුළු ජංගම බැරකම්		**996,348,759**	**857,825,048**	**861,180,778**
මුළු ස්කන්ධය හා බැරකම්		**1,874,057,497**	**1,304,372,045**	**1,352,133,867**

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමු.

.....

එන්. ඩී. ප්‍රියංකර කුමාර
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. පිටු අංක 15, 16 සහ 17 හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 19, 20 මෙන්ම 24 සිට 26 දක්වා ඇතුළත් අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත්ම අංග වේ.

එස්. ආලෝක බණ්ඩාර
සභාපති/අධ්‍යක්ෂ

බන්දුල ඩයස්
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයට අදාළ සටහන්

	නැවත ප්‍රකාශිත ගිණුම		
	2017	**2016**	**2016**
	රු.	රු.	රු.
16. තොගය			
අමුද්‍රව්‍ය	126,647,717	115,315,703	126,214,026
පාරිභෝගික භාණ්ඩ	10,702,665	5,895,747	5,895,747
අමතර කොටස්	36,540,074	39,183,613	39,183,613
ලෝහ භාණ්ඩ	1,447,563	1,318,179	1,318,179
නිමි තොගය	51,557,429	37,148,418	40,148,418
නොනිමි තොගය	25,816,228	25,945,869	35,912,383
	252,711,676	**224,807,529**	**248,672,366**
17. වෙළඳ ලැබීම්			
වෙළඳ ණයගැතියෝ	557,332,365	699,917,075	727,385,717
බොල් ණය සඳහා වෙන් කිරීම්	(23,984,510)	(21,216,887)	(21,216,887)
අ.ප්‍ර.දෙ. තත්ත්ව හානි/දඩ වෙන්කිරීම්	(6,381,589)	-	(3,571,658)
වෙනත් ණයගැතියෝ	361,309	704,061	704,061
	527,327,575	**679,404,249**	**703,301,233**
18. වෙනත් ලැබීම්			
සේවක ණය හා අත්තිකාරම් (සටහන 18.1)	19,503,611	21,242,423	21,242,423
තැන්පතු හා ලැබීම් (සටහන 18.2)	5,729,546	6,947,069	6,947,069
විකුණුම් පාලන ගිණුම	-	-	-
බැංකු ණය	3,409,883	184,499,971	184,499,971
අයකරවා ගතහැකි බදු (ඉ/ගෙ. යෙදවුම් වැට් බදු)	18,665,770	-	-
	47,308,810	**212,689,463**	**212,689,463**
18.1 සේවක ණය හා අත්තිකාරම්			
ආපදා ණය	15,795,710	18,321,617	18,321,617
උත්සව අත්තිකාරම්	2,728,000	2,254,000	2,254,000
සේවක වැටුප් අත්තිකාරම්	31,746	63,372	63,372
ණය හිමි අත්තිකාරම් ගිණුම	948,155	603,434	603,434
	19,503,611	**21,242,423**	**21,242,423**
18.2 තැන්පතු හා ලැබීම්			
තැන්පතු සඳහා ලැබීම්	5,202,903	6,571,772	6,571,772
අමතර වෙනත් ලැබීම්	526,643	375,296	375,296
	5,729,546	**6,947,069**	**6,947,069**
19. මුදල් හා මුදල්වලට සමාන දෑ			
බැංකුවේ ඇති මුදල්	47,879,960	36,275,656	36,275,656
මාර්ගස්ථ මුදල්	3,849,626	3,511,060	3,511,060
අතැති මුදල්	128,300	43,445	43,445
	51,857,886	**39,830,161**	**39,830,161**

මුදල් ගලා ඒම, මුදල් සහ මුදල් හා සමාන ප්‍රකාශනය සඳහා වන තොරතුරු පහත පරිදි වේ.

		නැවත ප්‍රකාශිත ගිණුම්	
	2017	**2016**	**2016**
	රු.	රු.	රු.
බැංකුවේ ඇති මුදල්	47,879,960	36,275,656	36,275,656
මාර්ගස්ථ මුදල්	3,849,626	3,511,060	3,511,060
අතැති මුදල්	128,300	43,445	43,445
	51,857,886	**39,830,161**	**39,830,161**
බැංකු අයිරා	(36,214,137)	(35,491,997)	(35,491,997)
	15,643,749	**4,338,164**	**4,338,164**

20. **විලම්බිත බදු බැරකම්**

වර්ෂය ආරම්භක දිනට	-	-	-
වර්ෂය තුළ ජනිත වූ/ තාවකාලික වෙනස්කම්	(11,268,578)	-	-
වර්ෂය අවසාන දිනට	**(11,268,578)**	**-**	**-**

21. **වෙළඳ ගෙවීම්**

වෙළඳ ණය හිමියන්	53,905,998	80,124,336	80,124,336
වෙනත් ණය හිමියන්	1,440,310	1,277,105	1,277,105
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	114,565,198	126,619,672	129,975,402
විකුණුම් අත්තිකාරම්	9,065	199,500	199,500
වෙනත් ණය හිමියන් (හර ශේෂය)	1,610,158	-	-
	171,530,729	**208,220,612**	**211,576,342**

22. **වෙනත් ගෙවීම්**

උපචිත වියදම්	41,193,629	42,982,314	42,982,314
තැන්පතු ගෙවීම්	1,448,159	1,778,779	1,778,779
	42,641,788	**44,761,093**	**44,761,093**

23. කෙටි කාලීන ණය

කෙටි කාලීන බැංකු ණය	697,050,043.00	-	-
ණයවර ලිපි සඳහා ගෙවීම් (DA කොන්දේසි මත)	48,912,062.00	-	-
	745,962,105.00	**0.00**	**0.00**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	නැවත ප්‍රකාශිත ගිණුම්		
	2017	**2016**	**2016**
	රු.	රු.	රු.
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය	**(229,273,949)**	**(74,649,560)**	**4,623,576**
බදු පෙර ලාභය			
ගැළපීම්:			
ස්ථාවර වත්කම් ක්ෂය	38,876,337	26,005,411	23,381,899
ජංගම නොවන වත්කම් විකුණුම්	(1,438,238)	(1,618,423)	(1,618,423)
පෙර වර්ෂයේ ගැළපීම්	3,010,982	(41,731,031)	(38,327,278)
මූල්‍ය වියදම්	95,754,406	58,130,262	58,130,262
පාරිතෝෂික සඳහා වසර තුළ වෙන්කළ ප්‍රතිපාදන	12,861,970	16,493,353	16,493,353
අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන් කිරීම	6,381,589	-	-
බොල්ණය සඳහා වෙන් කිරීම	(804,035)	4,389,122	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**(74,630,938)**	**(12,980,867)**	**62,683,389**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම			
තොගය (වැඩිවීම) / අඩුවීම	(27,904,147)	135,154,769	111,289,934
(වැඩිවීම්)/ වෙළඳ හා වෙනත් ලැබීම් අඩුවීම	142,827,462	(26,797,507)	(46,305,593)
(වැඩිවීම්)/ වෙනත් ලැබීම්වල අඩුවීම	165,380,653	(29,155,255)	(29,155,112)
ජංගම බැරකම්වල වැඩි/(අඩුවීම)	(13,527,720)	(7,487,680)	(33,805,151)
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය	**192,145,310**	**58,733,460**	**64,707,467**
ගෙවූ බදු	(36,191,121)	(30,000,000)	(25,000,000)
සේවක විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම	(9,346,132)	(15,031,482)	(15,031,482)
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය	**146,608,057**	**13,701,978**	**24,675,985**
ආයෝජන කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය			
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල්	1,445,242	1,875,319	1,875,319
දේපළ, පිරියත, උපකරණ මිලදී ගැනීම	(217,604,067)	(37,941,634)	(36,160,264)
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලාඒම	**(216,158,825)**	**(36,066,315)**	**(34,284,945)**
මූල්‍ය කටයුතුවලින් මුදල් ගලා ඒම			
ණයට ගැනුම් සඳහා ගෙවීම්	176,610,759	99,537,720	86,782,343
පොලී ගෙවීම	(95,754,406)	(58,130,262)	(58,130,262)
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම	**80,856,353**	**41,407,458**	**28,652,081**
ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) මුදල් හා මුදල්වලට සමාන දෑ	**11,305,585**	**19,043,121**	**19,043,121**
කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ	**4,338,164**	**(14,704,957)**	**(14,704,957)**
කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ (සටහන 19)	**15,643,749**	**4,338,164**	**4,338,164**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රාග්ධන නිකුතුව රු.	ප්‍රාග්ධන සංචිතය රු.	පොදු සංචිතය රු.	සංවර්ධන සංචිතය රු.	ප්‍රත්‍යාගණන ලාභය රු.	රඳවාගත් ඉපැයීම් සංචිත රු.	එකතුව රු.
2016. 01. 01 වැනි දිනට ශේෂය	15,000,000	102,491	1,000,000	13,901,142		312,036,107	**342,039,740**
පෙර වර්ෂයේ ගැළපීම්						(73,242,347)	**(73,242,347)**
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)						943,720	**943,720**
						239,737,480	**269,741,113**
ප්‍රත්‍යාගණන ලාභය						**36,015,363**	**36,015,363**
2016. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**102,491**	**1,000,000**	**13,901,142**		**275,752,843**	**305,756,476**
නැවත ප්‍රකාශිත ගිණුම් - 2016							
2016. 01. 01 දිනට ශේෂය	15,000,000	102,491	1,000,000	13,901,142	-	312,036,107	**342,039,740**
පෙර වර්ෂය සඳහා ගැළපීම්						(41,731,031)	**(41,731,031)**
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)						(74,973,687)	**(74,973,687)**
ප්‍රත්‍යාගණන ලාභය					36,015,363		**36,015,363**
2016. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**102,491**	**1,000,000**	**13,901,142**	**36,015,363**	**195,331,388**	**261,350,384**
2017. 01. 01 දිනට ශේෂය	15,000,000	102,491	1,000,000	13,901,142	36,015,363	195,331,388	**261,350,384**
පෙර වර්ෂයේ ගැළපීම්						3,010,982	**3,010,982**
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)						(229,273,949)	**(229,273,949)**
ප්‍රත්‍යාගණන ලාභය					665,177,449		**665,177,449**
2017. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**102,491**	**1,000,000**	**13,901,142**	**701,192,812**	**(30,931,579)**	**700,264,866**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය

	සටහන්	නැවත ප්‍රකාශිත ගිණුම		
		2017	**2016**	**2016**
		රු.	රු.	රු.
ආදායම	7	1,249,839,033	1,445,725,491	1,477,236,807
විකුණුම් පිරිවැය	8	(1,054,060,200)	(1,119,425,939)	(1,071,664,118)
දළ ලාභය		**195,778,833**	**326,299,552**	**405,572,689**
වෙනත් මෙහෙයුම් ආදායම	9	20,796,639	23,010,408	23,010,408
බෙදාහැරීමේ වියදම්	10	(14,788,906)	(29,399,000)	(29,399,000)
පරිපාලන වියදම්	11	(214,735,986)	(218,536,434)	(218,536,434)
වෙනත් මෙහෙයුම් සඳහා වියදම්	12	(122,949,949)	(120,412,881)	(120,412,881)
මෙහෙයුම් ලාභය		(135,899,369)	(19,038,355)	60,234,782
මූල්‍ය ආදායම		2,379,826	2,519,057	2,519,057
මූල්‍ය වියදම්	13	(95,754,406)	(58,130,262)	(58,130,262)
බදු පෙර ලාභය		**(229,273,949)**	**(74,649,560)**	**4,623,577**
ආදායම් බදු	14	-	(324,127)	(3,679,857)
බදු පසු ලාභය		**(229,273,949)**	**(74,973,687)**	**943,720**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය

	2017	**2016**	**2016**
	රු.	රු.	රු.
වාර්ෂික ලාභය (බදු පසු)	(229,273,949)	(74,973,687)	943,720
වෙනත් විස්තීරණ ආදායම්	-	-	-
ප්‍රත්‍යාගණන ලාභය	665,177,449	36,015,363	-
වර්ෂය තුළ මුළු විස්තීරණ ආදායම්	435,903,500	(38,958,324)	943,720

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

	නැවත ප්‍රකාශිත ගිණුම්		
	2017	**2016**	**2016**
	රු.	රු.	රු.
07. ආදායම්			
ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් ලද ආදායම	220,336,135	232,969,063	264,480,379
ප්‍රධාන මුද්‍රණාලයෙන් ලද ආදායම			
පෙළ පොත්	677,043,029	867,581,331	867,581,331
ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු)	317,971,907	318,142,269	318,142,269
ප්‍රකාශන	2,397,001	1,120,589	1,120,589
වෙනත් අලෙවි කටයුතුවලින් ලද ආදායම	32,090,961	25,912,239	25,912,239
	1,249,839,033	**1,445,725,491**	**1,477,236,807**
08. විකුණුම් පිරිවැය			
ප්‍රධාන මුද්‍රණාලය			
පරිභෝජනය කළ ද්‍රව්‍ය	423,890,328	472,735,620	461,837,298
සෘජු ශ්‍රමය	221,253,402	220,666,050	220,666,050
සෘජු කර්මාන්තශාලා වියදම්	50,380,456	49,955,422	49,955,422
වක්‍ර කර්මාන්තශාලා වියදම්	79,751,670	67,626,131	67,626,131
අනෙකුත් වියදම් / තොග ගැලපීම්	36,037,689	44,715,963	31,749,449
ප්‍රමාද ගෙවීම් හා දඩ (අ. ප්‍ර. දෙ.)	1,958,500	27,468,643	-
අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන්කිරීම්	6,381,589	-	3,571,658
	819,653,634	**883,167,829**	**835,406,008**
ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාව			
පරිභෝජනය කළ ද්‍රව්‍ය	165,056,830	138,553,147	138,553,147
සෘජු ශ්‍රමය	32,853,408	31,923,235	31,923,235
සෘජු කර්මාන්තශාලා වියදම්	2,972,534	3,080,806	3,080,806
වක්‍ර කර්මාන්තශාලා වියදම්	8,824,840	2,141,781	2,141,781
අනෙකුත් වියදම් / තොග ගැලපීම්	(7,838,664)	42,371,400	42,371,400
	201,868,948	**218,070,369**	**218,070,369**
ප්‍රකාශන අංශයේ පිරිවැය	**2,992,756**	**1,104,768**	**1,104,768**
අනෙකුත් අලෙවි අංශවල පිරිවැය	**29,544,862**	**17,082,973**	**17,082,973**
මුළු විකුණුම් පිරිවැය	**1,054,060,200**	**1,119,425,939**	**1,071,664,118**
09. වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම			
මුද්‍රණාලීය අබලි කොල සහ අනෙකුත් ද්‍රව්‍ය	17,948,931	20,652,638	20,652,638
ටෙන්ඩර් තැන්පතු	605,435	721,348	721,348
බොල් ණය සඳහා වෙන්කිරීම්	804,035	-	-
ස්ථාවර වත්කම් ඉවත්කිරීමේ ලාභ	1,438,238	1,618,422	1,618,422
ආපන ශාලාවෙන් ලද ආදායම	-	18,000	18,000
	20,796,639	**23,010,408**	**23,010,408**

		නැවත ප්‍රකාශිත ගිණුම්	
	2017	**2016**	**2016**
	රු.	රු.	රු.
10. බෙදාහැරීම් වියදම්			
ජාතිය ගොඩනැගීමේ බද්ද	8,390,599	19,079,461	19,079,461
මෝටර් රථවාහන නඩත්තුව	4,960,616	4,056,789	4,056,789
දැන්වීම් සඳහා	289,626	868,485	868,485
අලෙවි ප්‍රවර්ධන කටයුතු	471,083	802,361	802,361
බොල් ණය සඳහා ප්‍රතිපාදන	-	4,389,122	4,389,122
අලෙවිසැල නඩත්තු කිරීමට	7,200	79,183	79,183
ණය එකතු කිරීමේ කොමිස්	-	123,599	123,599
විකුණුම් කොමිස්	566,491	-	-
නිමි තොග ප්‍රවාහය	103,291	-	-
	14,788,906	**29,399,000**	**29,399,000**
11. ආයතන හා පරිපාලන වියදම්			
කුලී	2,907,278	2,299,533	2,299,533
ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු	2,085,568	1,600,155	1,600,155
විදුලිය	266,216	275,945	275,945
කාර්යාල උපකරණ නඩත්තුව	1,260,208	857,686	857,686
ක්ෂයවීම් - කාර්යාලයීය උපකරණ	676,348	2,264,181	2,264,181
- ගෘහභාණ්ඩ හා උපාංග	-	91,920	91,920
- පරිගණක මෘදුකාංග	3,111,393	3,707,011	3,707,011
- යතුරුපැදි	66,375	33,188	33,188
වරිපනම්	70,008	120,120	120,120
ජල ගාස්තු	81,858	55,523	55,523
වැටුප් හා වේතන	135,659,728	132,871,950	132,871,950
අතිකාල දීමනා	11,267,951	9,934,301	9,934,301
සේවක අර්ථසාධක අරමුදල	17,393,133	17,117,438	17,117,438
සේවක භාරකාර අරමුදල	4,348,285	4,279,362	4,279,362
දිරි දීමනා	2,371,000	2,407,500	2,407,500
සභාපති වේතනය	927,374	960,000	960,000
ක්‍රියාකාරී අධ්‍යක්ෂ වේතනය	780,000	780,000	780,000
අධ්‍යක්ෂ ගාස්තු	374,500	372,300	372,300
තැපැල් ගාස්තු	233,567	286,443	286,443
දුරකථන	1,680,641	1,401,580	1,401,580
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	5,047,569	6,970,620	6,970,620
පුවත්පත් දැන්වීම් හා ප්‍රකාශන	806,270	849,966	849,966
ප්‍රවාහනය හා යැපුම් දීමනා	1,428,331	1,752,656	1,752,656
පුවත්පත් හා වාර සඟරා	101,800	86,280	86,280
මෝටර් රථවාහන කුලී	4,235	967,138	967,138
විදේශ සංචාර / සේවක පුහුණුවීම් (විදේශ)	414,993	474,846	474,846
පොදු කාර්යාලයීය වියදම්	189,317	284,418	284,418
විගණන වියදම්	500,000	500,000	500,000
විවිධ වියදම්	52,988	350,939	350,939
නෛතික හා උපදේශන සේවා	174,000	683,157	683,157
චින්දනාත්මක කටයුතු	515,320	624,100	624,100
පාරිතෝෂික වියදම්	12,861,970	16,493,353	16,493,353
සේවක පුහුණු කිරීම්	592,300	490,905	490,905
විගණන හා කළමනාකරණ කමිටු ගාස්තු	153,000	208,215	208,215
අන්තර්ජාල / විද්‍යුත් තැපෑල	163,652	201,743	201,743
ටෙන්ඩර් මණ්ඩල තාක්ෂණික කමිටු වියදම්	704,400	485,450	485,450
25% මෝටර් රථවාහන නඩත්තුව	4,960,616	4,056,789	4,056,789
නවාතැන් පහසුකම්	-	72,030	72,030
අධ්‍යක්ෂ මණ්ඩල හමු සඳහා වියදම්	27,372	64,483	64,483

	නැවත ප්‍රකාශිත ගිණුම්		
	2017	**2016**	**2016**
	රු.	රු.	රු.
සාමාජික ගාස්තු	7,600	70,800	70,800
පරිත්‍යාග	254,828	775,032	775,032
පරිගණක කාර්යංශ සේවා ගාස්තු	167,340	179,050	179,050
මුදල් ප්‍රවාහන ගාස්තු	9,300	73,828	73,828
මුදල් පරිවාර ව්‍යදම්	-	9,952	9,952
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	37,357	94,551	94,551
	214,735,986	**218,536,434**	**218,536,434**

12. වෙනත් මෙහෙයුම් ව්‍යදම්

සේවක සුභසාධනය	24,880,059	25,177,725	25,177,725
සේවක වෛද්‍ය පහසුකම්	10,612,238	9,654,775	9,654,775
නිවාස ණය පොලී	3,113,525	4,273,617	4,273,617
කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා	50,190,854	53,029,119	53,029,119
විශේෂ දිරි දීමනා	7,490,000	6,630,000	6,630,000
කාර්ය මණ්ඩල ප්‍රවාහනය	11,012,114	4,877,244	4,877,244
නිවාඩු සඳහා ගෙවීම්	15,607,159	16,408,882	16,408,882
කාර්ය මණ්ඩල සම්මාන	44,000	68,000	68,000
උපයන විට ගෙවීම් බදු	-	293,519	293,519
	122,949,949	**120,412,881**	**120,412,881**

13. මූල්‍ය ව්‍යදම්

බැංකු ගාස්තු	7,276,412	9,702,557	9,702,557
බැංකු අයිරා පොලී	6,462,707	2,217,657	2,217,657
බැංකු ණය පොලී - කෙටි කාලීන	82,015,287	46,210,048	46,210,048
බැංකු ණය පොලී - දිගු කාලීන	-	-	-
	95,754,406	**58,130,262**	**58,130,262**

14. ආදායම් බදු

වසර සඳහා ආදායම් බදු ප්‍රතිපාදන	-	324,127	3,679,857
	-	**324,127**	**3,679,857**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

15. දේපළ, පිරියත සහ උපකරණ

විස්තරය	2015.12.31 දිනට	ආරම්භක ශේෂයේ වෙනස	වර්ෂය තුල එකතුවීම් හා ප්‍රත්‍යාගණනය	වර්ෂය තුල ඉවත් කිරීම්	ප්‍රත්‍යාගණන/ පිරිවැය 31. 12. 2016	වර්ෂය තුල ඉවත් කිරීම්	ප්‍රත්‍යාගණනය 01.01.2017	වර්ෂය තුල එකතුවීම් 2017	2017. 12. 31 දිනට ශේෂය
පිරිවැයට									
ඉඩම්	475,126	-	-	-	475,126	-	378,500,000	-	378,500,000
ගොඩනැගිලි	38,020,440	-	-	-	38,020,440	-	166,600,000	-	166,600,000
* පිරියත හා යන්ත්‍රෝපකරණ	236,452,325	1,512,429	15,798,845	(9,978,137)	243,785,462	(3,497,103)	210,667,100	212,640,604	423,307,704
* කර්මාන්ත උපාංග හා වර්ග	2,215,086	-	153,575	-	2,368,661	-	-	-	-
මෝටර් හා වෙනත් වාහන	45,807,299	(1,512,429)	11,501,130	(225,000)	55,571,000	(8,000)	-	-	55,563,000
** කාර්යාලයීය උපකරණ	31,450,774	-	4,126,258	-	35,577,032	-	5,879,200	3,449,693	9,328,893
** ලී බඩු හා සවිකිරීම්	4,410,226	-	66,321	-	4,476,547	-	-	-	-
පරිගණක හා උපාංග	35,793,321	-	4,514,135	-	40,307,456	-	4,186,450	1,513,770	5,700,220
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,951	-	-	-	2,572,951	-	-	-	-
එකතුව	**397,197,548**	**-**	**36,160,264**	**(10,203,137)**	**423,154,675**	**(3,505,103)**	**765,832,750**	**217,604,067**	**1,038,999,817**
සමුච්චිත ක්ෂය වීම්									
විස්තරය	**As at 31.12.15**	**Opening Balance Difference**	**Annual Depreciation 2016**	**Disposals during the year**	**Accumulated Depreciation 31.12.2016**	**Disposals during the year**	**Revaluations/ Cost 01.01.2017**	**Annual Depreciation 2017**	**Accumulated Depreciation 31.12.2017**
ගොඩනැගිලි	29,010,891		783,417	-	29,794,308		-	4,165,000	4,165,000
පිරියත හා යන්ත්‍රෝපකරණ	173,897,615	1,208,598	9,215,415	(9,948,690)	174,372,938	(3,497,099)	-	17,030,847	17,030,847
කර්මාන්ත උපාංග වර්ග	1,936,303		123,021	-	2,059,324		-	-	-
ලී බඩු හා සවිකිරීම්	3,919,179		91,920	-	4,011,099		-	-	-
මෝටර් හා වෙනත් වාහන	36,289,502	1,414,914	7,038,691	(37,796,733)	6,946,374	(1,000)		13,892,750	20,838,124
කාර්යාලයීය උපකරණ	19,142,884		2,264,181	-	21,407,065		-	676,348	676,348
පරිගණක හා උපාංග	30,748,258		3,865,255	-	34,613,513	-	-	3,111,392	3,111,392
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,950		-	-	2,572,950		-	-	-
එකතුව	**297,517,582**	**2,623,512**	**23,381,899**	**(47,745,423)**	**275,777,570**	**(3,498,099)**		**38,876,337**	**45,821,711**
ලියා හල අගය	**99,679,966**				**147,377,105**				**993,178,106**

* / ** revalued under one category during the year

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එම්ඊඩී/ඩී/එස්පීසී/1/17/110 මගේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් // දින

සභාපති

රාජ්‍ය මුද්‍රණ සංස්ථාව.

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS)

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 07 හි 31 සහ 33 වන ඡේද ප්‍රකාරව සංස්ථාවේ මූල්‍ය උපකරණ (Financial Instruments) වලින් සමාලෝචිත වර්ෂයේ අවසානයට පැන නඟින අවදානම්වල ස්වභාවය හා තරම ඇඟයීම පිණිස අවශ්‍ය වන පහත සඳහන් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

- සංස්ථාවේ මූල්‍ය අවදානම් කළමනාකරණයේ අරමුණු හා ප්‍රතිපත්ති
- මූල්‍ය අවදානම හා අවදානම් ඇතිවිය හැකි ආකාර

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධනය තුළ ඇතුළත් සංචිතයන්ගේ ස්වභාවය, පවත්වාගෙන යාමේ අරමුණ ආදිය පිළිබඳව හෙළිදරව් කිරීම අවශ්‍ය වුවද සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන රු. 102,491 ක් වූ ප්‍රාග්ධන සංචිතය, රු.1,000,000 ක් වූ පොදු සංචිතය හා රු. 13,901,142 ක් වූ සංවර්ධන සංචිතය හා රු. 701,192,812 ක ප්‍රත්‍යාගණන සංචිතය පිළිබඳව හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයෙහි 125 ඡේදය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව විසින් කඩදාසි මිලදී ගැනීම වෙනුවෙන් විවෘත කර තිබූ රු. 6,648,040 ක ණයවර ලිපි වටිනාකම මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස් වීම තුළ ඇතුළත් වෙළඳ ණයහිමි හා අනෙකුත් ණයහිමි ශේෂවල අඩුවීම රු. 358,925 ක් අඩුවෙන් සටහන් කර තිබූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධනය වෙනස් වීම තුළ ඇතුළත් වෙළඳ ණය ගැති සහ අනෙකුත් ණය ගැති ශේෂ වල අඩුවීම ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව රු. 142,927,462 ක් වුවද එය රු. 142,827,462 ක් ලෙස දක්වා තිබුණි.

(ii) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඇතුළත් නොවූ පෙර වර්ෂයේ ගැලපීම් ලෙස රු.3,010,982 ක අවිනිශ්චිත ශේෂයක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ලද මුදලක් සේ පෙන්වමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළනය කර ඇතත් ඒ තුළ හඳුනා නොගත් ගැලපීම් රු. 111,345 ක් ඇතුළත් කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලද වාර්තාවන්ට අනුව ලිතෝ අංශයේ යන්ත්‍ර හා උපකරණ වටිනාකම රු. 146,820,000 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයන් හි දී ලිතෝ අංශයේ යන්ත්‍ර හා උපකරණ තක්සේරු වටිනාකම රු. 40,000,000 ක් ලෙස දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.106,820,000 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. ඒ තුළින් ප්‍රත්‍යාගණන සංචිතය රු. 106,820,000 ක් අඩුවෙන් සහ වාර්ෂික ක්ෂය රු. 8,011,500 ක් අඩුවෙන් සටහන් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අලාභය රු. 8,011,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.4 නොසැසඳුනු පාලන ගිණුම්

ණයහිමි පාලන ගිණුමේ සහ ණයහිමි ලෙජරයේ ශේෂ සැසඳීම සඳහා සැසඳුම් ප්‍රකාශයක් සකස් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණයහිමි ශේෂය ණයහිමි ලෙජරයේ ශේෂයන්ට වඩා රු. 1,456,119 ක් වැඩි බව නිරීක්ෂණය විය. තවද ණයහිමි ලෙජරයේ රු. 1,941,784 ක් වූ ණයහිමියකු රු. 194,178 ක් ලෙස ණයහිමි ලේඛනයට ඇතුළත් කර තිබුණි.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථ කිරීම් අනුව එම දෙපාර්තමේන්තුවට රු. 10,535,542 ක් අයවීමට ඇති බව දන්වා තිබුණද සංස්ථාව විසින් එම දෙපාර්තමේන්තුව සඳහා රු. 2,754,825 ක මුදලක් පමණක් ගෙවීමට ඇති බවට ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණි.

(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථ කිරීම් අනුව එම දෙපාර්තමේන්තුව විසින් ගෙවීමට කිසිදු ණය ශේෂයක් නොමැති බවට දන්වා තිබුණද එම දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව වෙත රු. 11,836,011 ක මුදලක් ගෙවීමට ඇති බවට සංස්ථාවේ ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ණයහිමි ශේෂය රු. 53,905,998 ක් වූ අතර ඉන් වටිනාකම රු. 10,056,845 ක් ණයහිමි කාල විශ්ලේෂණයට අනුව 2013 වර්ෂය සහ ඊට පෙර සිට පවතින බේරුම් නොකරන ලද ණය ශේෂවිය. එය මුළු ණයහිමියන්ගෙන් සියයට 19 කි.

(ආ) වර්ෂ 04 ට වැඩි එකතුව රු. 147,033,354 ක් වූ වෙළඳ ණයගැති ශේෂයක් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය වූ රු. 527,327,575 කින් සියයට 28 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික කඩදාසි සමාගමෙන් සංස්ථාව වෙත රු. 9,753,427 ක් අයවීමට තිබූ අතර සංස්ථාව විසින් කඩදාසි සමාගමට ගෙවිය යුතු මුදල රු. 7,460,675 ක් වී තිබුණි. මෙම ශේෂ තුළ අවුරුදු 04 ඉක්මවූ ණය මුදල පිළිවෙලින් රු. 7,989,976 ක් සහ රු. 5,578,142 ක් වූ නමුත් මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. කඩදාසි සමාගමේ ව්‍යාපාර කටයුතු නතරවීම නිසා මෙම ශේෂ නිරවුල් කිරීම පිළිබඳව අවිනිශ්චිතතාවයක් නිරීක්ෂණය කෙරේ.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

	නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 41 වගන්තිය	ගිනි අනතුරු ඇගවීමේ සංඥා පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි.
(ආ)	2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය 4.2 වගන්තිය	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සංස්ථාවේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 15 දෙනෙකු සඳහා කණ්ඩායම් ප්‍රවාහන සේවය සැපයීමට කටයුතු නොකර එක් අයෙකුට මාසිකව රු. 17,500 බැගින් සමාලෝචිත වර්ෂයේ රු. 3,132,500 ක දීමනා ගෙවා තිබුණි.

(ඇ)	2017 දෙසැම්බර් 11 දිනැති අංක PED 03/2017 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 01, 02 සහ 03 වගන්ති	චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු. 50,190,854 ක මුදලක් ප්‍රසාද දීමනා ලෙස සංස්ථාවේ සභාපතිගේ නිර්දේශය මත පමණක් පදනම්ව ගෙවා තිබුණි.
(ඈ)	2017 පෙබරවාරි 03 දිනැති අංක 2004/66 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය	සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී තොරතුරු ඉල්ලීමේ ලියාපදිංචි ලේඛනය, අභියාචනා ලේඛනය හා ප්‍රතික්ෂේප කළ විස්තර අඩංගු ලේඛනය නඩත්තු කර නොතිබුණි.
(ඉ)	2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	රාජ්‍ය ආයතන විසින් පුරවැසි ප්‍රඥප්තියක් හඳුන්වා දී ඒ සඳහා ආයතනික යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීම සිදු කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 229,273,949 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 74,649,560 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 154,624,389 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දල අතිරික්තය රු. 130,520,719 කින් අඩුවීම හා මූල්‍ය වියදම් රු. 37,624,144 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අතිරික්තයක් වාර්තා කර තිබුණද 2016 හා 2017 වර්ෂයන්හි ඌනතාවයක් සිදුවී තිබුණි. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ ඌනතාවය සියයට 207 කින් වැඩිවී රු. 229,273,949 ක් වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.550,885,453 ක් වූ සංස්ථාවේ දායකය වර්ධනය වී 2017 වර්ෂය අවසානයේදී රු. 579,601,971 ක් වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සංස්ථාවේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය 2013 වර්ෂයේ සිටම පිරිහෙමින් පැවතුණි. 2013 වර්ෂයේදී පිළිවෙලින් සියයට 35 ක් සහ සියයට 3 ක් වූ දළ ලාභ හා ශුද්ධ ලාභ අනුපාත සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් සියයට 16 ක් සහ සියයට සෘණ 18 ක් දක්වා පිරිහී තිබුණි.

එසේම සංස්ථාවේ ද්‍රවශීලතාවය නිරූපණය කරන ජංගම සහ ක්ෂණික අනුපාතයද පිරිහී තිබුණි. 2013 වර්ෂයේදී පිළිවෙලින් 1.4:1 ක් සහ 1.05:1 ක් වූ ජංගම සහ ක්ෂණික අනුපාත සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් 0.88:1 ක් සහ 0.63:1 ක් දක්වා පිරිහී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ අරමුණු ඉටු කිරීමේ කාර්යසාධනය පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම සහ ලොතරැයි මුද්‍රණය කිරීම වෙනුවෙන් පිළිවෙලින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් සහ ජාතික ලොතරැයි මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 677,043,029 ක් සහ රු. 216,501,470 ක් වශයෙන් එකතුව රු. 893,544,499 ක ආදායමක් ලැබී තිබුණි. එය වර්ෂයේ සමස්ත ආදායම වූ රු. 1,249,839,033 කින් සියයට 71 ක් වූ බැවින් සංස්ථාව විසින් සිය ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය නොකර ආදායම් මූලාශ්‍ර දෙකක් පමණක් මත පදනම් වන බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාව විසින් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ආයතනයක් විසින් හෝ මුද්‍රණය කරනු ලබන පොත්පත්, අධ්‍යාපනික ප්‍රකාශන, පුවත්පත්, සඟරා හා වෙනත් ප්‍රකාශන විකිණීම, බෙදාහැරීම, අපනයනය කිරීම හා ආනයනය කිරීම සංස්ථාවේ අරමුණුගත කාර්යයන් වූ අතර එමඟින් 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා උපයාගත් ආදායම්, සංස්ථාවේ සමස්ත ආදායමින් සියයට 0.01 සිට 0.18 දක්වා පරාසයක වූ බැවින් එම අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අලෙවි සැලැස්මට අනුව සංස්ථා ප්‍රකාශන අලෙවි කිරීමට පාසල් 24 ක හා රාජ්‍ය ආයතන 10ක ප්‍රදර්ශන 34 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද ආයතන දෙකක ප්‍රදර්ශන දෙකක් පමණක් පවත්වා, පිරිවැය අධික වීම යන හේතුව මත ප්‍රදර්ශන පැවැත්වීම අතහැර තිබුණි. කෙසේ වුවද පිරිවැය අධික වීම මත එම තීරණය ගෙන තිබූ නමුත් නිසි පිරිවැය ගණනය කිරීමක් හෝ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් හෝ සිදුකර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2018 වර්ෂය වෙනුවෙන් පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 වර්ෂය සඳහා පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම පිණිස පුද්ගලික ආයතනයක් මඟින් ආනයනය කරන ලද එකතු වටිනාකම රු. 179,801,775 ක් වූ කඩදාසි මෙට්‍රික් ටොන් 1,520 ක් වරායෙන් ප්‍රමාදවී නිදහස් කරගෙන තිබුණි. ඒ මත රු. 5,037,480 ක් වූ ප්‍රමාද ගාස්තුවක් ආනයනකරු වන උක්ත පුද්ගලික සමාගම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු වුවද එම ප්‍රමාද ගාස්තුවෙන් රු. 1,457,013 ක් සංස්ථාව විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවා තිබුණි.

(ආ) පාසල් පෙළ පොත් මුද්‍රණය සඳහා භාවිතා කරන ලද ආනයනික කඩදාසිවල දීප්තිය අඩුවීම නිසා ඒවා භාවිතා කර මුද්‍රණය කරන ලද පාසල් පෙළ පොත් වර්ග 18 ක් වෙනුවෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවට ගෙවිය යුතු මුදලින් රු.1,084,990 ක් දඩ වශයෙන් අඩු කරගෙන තිබුණි.

(ඇ) පාසල් පෙළ පොත් මුද්‍රණය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව එම පෙළ පොත් කවරය සඳහා 220 GSM වර්ගයේ "Double Side Coated Art Board" භාවිතා කළ යුතු වුවද, ඒ වෙනුවට 230 GSM වර්ගයේ

"Double Side Coated Art Board" භාවිතා කිරීම නිසා සංස්ථාවට රු. 1,056,362 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. නිෂ්පාදනය සඳහා අදාළ 220 GSM වර්ගයේ කඩදාසි තොග ප්‍රශස්ත මට්ටමින් පවත්වා නොගැනීම මෙයට හේතු විය.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සංස්ථාවේ අලෙවිසැල් 12 න් අලෙවිසැල් 11 ක් සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත විකුණුම් වලින් සියයට 22 සිට සියයට 68 දක්වා පරාසයක සිය අලෙවි ඉලක්ක සපුරාගෙන නොතිබුණි.

4.4 ඌන උපයෝජිත වත්කම්

සංස්ථාවේ ඇති ලිතෝ මුද්‍රණ අංශය, උත්තල මුද්‍රණ අංශය හා පොත් බැඳීමේ අංශයන්හි අයවැයගත යන්ත්‍ර පැයවලින් පිළිවෙලින් සියයට 33, සියයට 34 හා සියයට 85 ක් වශයෙන් එකතු යන්ත්‍ර පැය 100,974 ක් මුද්‍රණ වැඩ නොමැතිවීම නිසා වර්ෂය තුළදී උපයෝජනය කර නොතිබුණි. ඒ හේතුවෙන් එම අංශයන්හි සේවයේ නියුතු 238 ක් වූ කාර්යමණ්ඩලයද එම කාලය තුළ සිය කාර්යයන් සඳහා අනුයුක්ත වී නොතිබුණි.

4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සංස්ථාවේ සම්පත්

සංස්ථාව සතු පාදුක්ක පානළුවෙහි පිහිටි ඉඩමෙන් තක්සේරු වටිනාකම රු. 107,000,000 ක් වූ අක්කර 13 රූඩ් 02 පර්චස් 06 ක ප්‍රමාණයක කර්මාන්ත පුරයක් ඇති කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබාදී තිබුණි. එහෙත් මෙම ඉඩම නීත්‍යානුකූලව එම මණ්ඩලයට පවරා දීමට හෝ ආපසු ලබා ගැනීම පිළිබඳව නිශ්චිත තීරණයකට එළඹීමට සංස්ථාව ක්‍රියාකර නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 2012 වර්ෂයේදී සකස් කර තිබූ අතර වර්තමානයේදී සංස්ථාව මිලදී ගත් යන්ත්‍රෝපකරණ හා සංස්ථාවේ නිෂ්පාදන ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් අවශ්‍යතාවය අනුව කාර්ය මණ්ඩලය (Cadre Assessment) සංශෝධනය කරවා ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ පුහුණු වැඩ සටහන් 36 න් 05 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර පුහුණු සැලැස්මට බාහිරව වැඩසටහන් 11 ක් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද මෙම වැඩසටහන් අතරින් මුද්‍රණ කාර්යයන්හි නියුතු කාර්ය මණ්ඩලය වෙනුවෙන් පුහුණු වැඩසටහන් 04 ක් පවත්වා තිබුණද මුද්‍රණ කටයුතු වල නියුතු 476 දෙනෙකුගේ කාර්ය මණ්ඩලයෙන් ඒ සඳහා සහභාගී කර තිබුණේ 17 දෙනෙකු පමණි.

4.7 වෙළඳපොළ කොටස

තරහකාරී වෙළඳපොළක ක්‍රියාත්මක වන රාජ්‍ය මුද්‍රණ සංස්ථාව විසින් සිදුකරන අභ්‍යාස පොත් නිෂ්පාදනය, ප්‍රකාශන ග්‍රන්ථ පලකිරීම සහ වෙනත් වාණිජ මුද්‍රණ සම්බන්ධයෙන් තමන්ගේ වෙළඳපොළ කොටස අවබෝධකර ගැනීම සඳහා වෙළඳපොළ සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂයන්හිදී සිදුකර නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්කකරා ලඟාවිය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ලඟාවීම මැනබැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 ප්‍රසම්පාදනය

ලොතරැයි මුද්‍රණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 203,509,234 ක් වැය කර ඉතාලියේ නිෂ්පාදිත Variable Data මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිලදී ගැනීමට අදාලව ඉදිරිපත් වූ ලංසුවල තාක්ෂණික පිරිවිතර සැසඳීමක් සිදු නොකර මිල ගණන් මත පමණක් පදනම්ව සැපයුම්කරු තෝරාගෙන තිබීම නිසා ශාක්‍යතා හා ඇගයීම් වාර්තාව අනුව මිලදී ගැනීමට අපේක්ෂිත මුද්‍රණ වේගය මිනිත්තුවට මීටර් 230 ක්වූ ෂඩ්වර්ණ මුද්‍රණ යන්ත්‍රය වෙනුවට මුද්‍රණ වේගය මිනිත්තුවට මීටර් 80 ක හා VDP කැමරා ඒකකයේ උපරිම වේගය මිනිත්තුවට මීටර් 50 ක්වූ ෂඩ් වර්ෂ මුද්‍රණ යන්ත්‍රය මිලදීගෙන තිබුණි.

ෂඩ් වර්ණ මුද්‍රණ ඒකකයේ මුද්‍රණ වේගය විනාඩියකට මීටර් 110 ක් බවත් VDP කැමරා හා එකීමේ (Folding) ඒකකයේ වේගය විනාඩියට මීටර් 65 ක් බවත් සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් විගණනයට දන්වා තිබුණි.

6.2 අයවැය පාලනය

වියදම් අයිතම 20 කට අදාලව අයවැයගත හා සත්‍ය වියදම සැසඳීමේදී සියයට 20 සිට සියයට 3,333 දක්වා පරාසයන් තුළ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS)

සංස්ථාවේ මූල්‍ය අවධානම් කළමනාකරණයේ අරමුණු හා ප්‍රතිපත්ති සහ මූල්‍ය අවදානම හා අවදානම් ඇති විය හැකි ආකාර සම්බන්ධයෙන් ඉදිරි ගිණුම් වර්ෂවලදී හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) සංස්ථාවේ ආරම්භක මූල්‍ය ප්‍රාග්ධනය රජයේ ඒකාබද්ධ අරමුදලින් ලබා දී ඇති අතර ඒ තුළ ප්‍රාග්ධන සංචිතය ද, පොදු සංචිතයක් ද, සංවර්ධන සංචිතය ද ඇතුළත් වේ. එය ප්‍රථම අවසාන ගිණුම් කට්ටලයේ සිට මේ දක්වා ඉදිරියට ගෙන ආ ශේෂයන් වේ.

ප්‍රත්‍යාගණන සංචිතය තුළ 2016 වසරේ සිදු කළ වත්කම් ප්‍රත්‍යාගණනයන් රු. 36,015,363 ක් ද, 2017 වසරේ සිදුකළ වත්කම් ප්‍රත්‍යාගණනයෙන් රු. 665,177,449 ක ලාභයක් ද ඇතුළත් වේ.

(ii) 2017.12.31 දිනට නිකුත් කර තිබූ රු. 6,648,040/- වටිනාකමැති ණයවර ලිපිය සඳහා 2018 මාර්තු මස භාණ්ඩ ලැබී පසුව කෙටි කාලීන ණය බවට පත්වී ඇත.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

(i) මෙම දෝෂයන් නැවත ඇති නොවීමට කටයුතු යොදා ඇත.

(ii) ඉදිරියේදී සියලු ගැලපීම් සඳහා විස්තර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කටයුතු සිදුකර අවසන් කළද එම වාර්තා සංස්ථාව වෙත ලබාදීමේ ප්‍රමාදයක් ඇතිවිය. අවසාන ගිණුම් සකස්වන අවස්ථාවේදීම අදාළ වාර්තාවේ අඩංගු දත්තයන් නැවත පරිගණක ගත කොට එකතුව ලබා ගැනීමේදී සිදුවූ දෝෂයක් හේතුවෙන් මෙම වරද සිදුව ඇත. එබැවින් 2018 ගිණුම් වර්ෂය ආරම්භයේදී ජර්නල් සටහන් අංක 180012 මගින් දැනටමත් නිවැරදි කර ඇති අතර, මෙවන් දෝෂයක් ඉදිරියේදී ඇති නොවීමට කටයුතු යොදා ඇත.

2.2.4 නොසැසඳුනු පාලන ගිණුම

(i) ගිණුම්කරණ පැකේජය තුළින් ලබාගන්නා ලද ණය හිමි පාලන ගිණුමේ ශේෂය වූ රු. 53,905,997/-නිවැරදිව මූල්‍ය ප්‍රකාශණවල දක්වා ඇත. එක් එක් ණය හිමියන් වෙනුවෙන් නඩත්තුකරන (manual) ලෙජර් කාඩ්පත්වල පැහැදිලි වූ දෝෂයන් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) එක් ලෙජර් කාඩ් පතක ශේෂයක් කාල විශ්ලේෂණ වාර්තාවට පිටපත් කිරීමේදී මෙම දෝෂය සිදුවී ඇත. ඉහත (i) හි සඳහන් සංශෝධන කටයුතු ලෙජර් කාඩ්පත්වල සිදු කිරීමේදී වැරදි නිවැරදි වී ණය හිමි පාලන ගිණුම් ශේෂයට සමාන වනු ඇත.

2.2.5 පැහැදිලි නොකළ වත්කම්

(අ) මුදල් අංශයට ඉදිරිපත් කර ඇති වවුචර්පත් අනුව ප්‍රතිපාදන සලසා ඇති අතර, වැඩ අංශයෙන් හා සැපයුම් අංශයෙන් තොරතුරු ලද විගස අදාල ගෙවිය යුතු නිවැරදි ශේෂය ගිණුම්වලට සටහන් කරනු ලැබේ.

(ආ) ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වෙත රු. 11,836,011/- ක මුදලක් මුද්‍රණ කාර්යයකින් අඩුකිරීම සම්බන්ධව නැවත වරක් ලිඛිතව ඉල්ලීම් කිරීමට කටයුතු යොදා ඇත.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) පෙර වර්ෂවල ණය හිමියන් බොහොමයක්ම නැවත ගෙවිය යුතු තත්ත්වයේ නොමැති අතර මේවන විට එම ශේෂයන් පිළිබඳව විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. එබැවින් එම ශේෂයන් සම්බන්ධව සොයා බලා නිසි අනුමැතියක් යටතේ අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) පැරණි ණය ගැතියන් සම්බන්ධව කටයුතු කිරීම විධිමත් කිරීම සඳහා ගණකාධිකාරී (ආදායම්) යටතට එම කටයුතු පත්කර ඇති අතර නීති නිලධාරී මගින් ද අවශ්‍ය නීති ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

(ඇ) ජාතික කඩදාසි සමාගම විසින් මුදල් ගෙවීමක් හෝ සංස්ථාව විසින් මුදල් ගෙවීමක් සිදු නොකරන ලද අතර භාණ්ඩ හුවමාරුවක් පමණක් සිදු වූ අතර එහි වටිනාකම් ලෙජර් කාඩ් පත්වල සඳහන් වී ඇත. ඒ අනුව 2017.12.31 දිනට රු. 2,292,752 ශේෂයක් සඳහා කඩදාසි හෝ බෝඩ් ලබා ගැනීමේ හැකියාවක් තිබුණි. එහි දැනට නිෂ්පාදන කටයුතු සිදු නොවන බැවින් ඉහත ශේෂ සම්බන්ධයෙන් නිර්ණයක් ගැනීමට සිදුවේ. මෙම ණය මුදල නිරවුල් කරන ලෙස එම ආයතනයේ නිසි බලධාරීන් වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

2.4 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) අනතුරු ඇඟවීමට සවිකර ඇති සයිරන් නලාව ක්‍රියාත්මකව පැවති අතර, එය දැනට අක්‍රියව ඇති බැවින් සයිරන් නලාවක් අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. අනතුරු ඇඟවීමේ ස්වයංක්‍රීය සංඥා පද්ධතියක් සවිකිරීමට ඉදිරියේදී කටයුතු යොදා ඇත.

(ආ) සංස්ථාවේ පවතින සීමිත වාහන සංඛ්‍යාව සියලු මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා විවිධ ප්‍රදේශවලට යෙදවීමට අපහසු බැවින් කළමනාකාරිත්වය මෙම තීරණය ගෙන තිබුණි. PED 1/2015 අනුව කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය පිළිගත නොහැකි බව දන්වා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ලිපියක් එවා ඇත. එම ලිපිය අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර තීරණයක් ගැනීමට නියමිතව ඇත.

(ඇ) සංස්ථා සභාපතිවරයාගේ 2017.12.14 දිනැති ප්‍රසාද දීමනා ගණනය කර ගෙවීම සම්බන්ධ ලිපියේ අනුමැතිය පරිදි සුපුරුදු ලෙස මෙම දීමනාව පෙර වර්ෂවල පරිදි සේවකයන් වෙත ගෙවීම් කර තිබේ.

(ඈ) 2016 අංක 12 දරන තොරතුරු පනතට අදාළව අවශ්‍ය නිලධාරීන් දැනුවත් කර ඇති අතර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ක්‍රියාත්මක කරනු ලබන ආකෘති හා ලේඛන උපයෝගී කරගෙන ලිපි ලේඛන සකස්කර ගැනීමට කටයුතු සිදුකරනු ලැබේ.

(ඉ) අංක 05/2008 දරන හා 2008 පෙබරවාරි 06 දිනැතිව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව එහි මූලික කටයුතු ඉටුකර ඇත. විධිමත් කමිටුවක් මගින් එම කාර්යය ඉටුකළ යුතු අතර වර්ෂයේ අවසන් භාගයේ නිෂ්පාදන කටයුතු සඳහා පැවරෙන කාර්යයන් ඉටු කිරීමට යාමේදී යම් අතපසුවීමක් සිදුව ඇත. ඉදිරියේදී කටයුතු කිරීමට අවධානය යොමු කර ඇත.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

අවධානයට යොමු කර තිබේ.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

දළ ලාභ හා ශුද්ධ ලාභ අනුපාතය මෙන්ම ජංගම සහ ක්ෂණික වත්කම් අනුපාතය ද වර්ධනයට පියවර ගනු ලැබේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

(අ) සංස්ථාවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍ර පහත පරිදි වේ.

ආදායම් මූලාශ්‍ර	2017 ආදායම	ආදායම් ප්‍රගතියක් ලෙස	විශේෂ කරුණු
පාසල් පෙළ පොත්	677,043,029/-	54.2%	ආදායම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලැබෙන ඇණවුම මත සීමා වේ.
ලොතරැයි මුද්‍රණය	216,501,470/-	17.3%	ලොතරැයි පත් අලෙවිය මත සීමාවේ.
වාණිජ මුද්‍රණ	101,470,435/	8.1%	පිරිවැය හා මුද්‍රණ ප්‍රමිතිය මත ඇණවුම් ලෙසට සීමා වේ.
අභ්‍යාස පොත් අලෙවිය	220,336,134/-	17.6%	නිෂ්පාදනය පූර්ණ ධාරිතාවය ආසන්නයට පැමිණ ඇත.
බාහිර ලිපිද්‍රව්‍ය අලෙවිය	32,090,961/-	2.6%	සැපයුම්කරුවන් වෙත මුදල් ගෙවීම හා වෙළඳපොළ මිල මත ආදායම තීරණය වේ.
ප්‍රකාශන අලෙවිය	2,397,000/-	0.2.%	ආදායම් වර්ධනයට ප්‍රකාශකයෙකු ලෙස තවදුරටත් ස්ථාවරවීම අවශ්‍ය වේ.
එකතුව	1,249,839,029		

ඉහත සඳහන් පරිදි ආදායම් මූලාශ්‍ර සැලකිය යුතු ප්‍රමාණයක් ඇති අතර එක් එක් මූලාශ්‍රය තුළ පවතින ඇතැම් ගැටලු මත ආදායම් ලැබීම් සීමා වී ඇති අතර එක් එක් මූලාශ්‍රයෙහි පවතින ගැටලු හඳුනාගැනීමටත් ඒ සඳහා ඉදිරියේදී පිළියම් යෙදීමටත් කටයුතු කිරීමට සැලසුම් කරනු ඇත.

(ආ) 2009 න් පසුව සංස්ථාවේ ප්‍රකාශන අංශය සඳහා සහකාර කළමනාකරුවෙකු 2016 වසරේ බඳවාගත් අතර ඔහු විසින් පවතින තත්ත්වයන් අධ්‍යයනය කර, ගතහැකි ක්‍රියාමාර්ගයන් කෙරෙහි අවධානය යොමු කරයි.

2012 වසරේ සිට නව ප්‍රකාශන මුද්‍රණයට පත් නොකරන ලද අතර පැවති ප්‍රකාශන අලෙවි කිරීම පමණක් සිදුවීම නිසා ආදායම් සීමාවී තිබුණි.

2016 වසරේ ප්‍රකාශන කිහිපයක් පමණක් මුද්‍රණය කළ අතර එමගින් කුඩා වර්ධනයක් පෙන්වීමට හැකි වී ඇත. වෙළඳපොළට උචිත හා ශීඝ්‍රයෙන් අලෙවි කළ හැකි ප්‍රකාශන බිහි කිරීමට අදාළ අති විශාල වැඩ කොටසක් සිදුකළ යුතුව ඇති අතර සහකාර කළමනාකරු (ප්‍රකාශන) විසින් ඊට අදාළ පසුබිම සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. සැලකිය යුතු වර්ධනයක් අත්කර ගැනීම සඳහා තවත් වසර කිහිපයක් ගතවනු ඇත.

(ඇ) සංස්ථා ප්‍රකාශන අලෙවි කිරීමට ප්‍රදර්ශන 34 ක් සැලසුම් කර 02 ක් පමණක් පැවැත්වීම අදාළ සැලසුම ඉදිරිපත් කරන ලද නිලධාරියා විසින් වෙළඳපොළ අවස්ථාවන් හඳුනාගෙන ක්‍රමිකව වෙළඳපොළ වර්ධනයක් අරමුණු කරගෙන සැලසුම් කර ඇති අතර සංස්ථාවේ පවතින භෞතික සම්පත් හා අතිරේක ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමු නොකර සැලසුම් කර ඇති අතර, පාසල්වලින් අපේක්ෂිත පරිදි ආරක්ෂිත ගබඩා පහසුකම් ලබා ගැනීමට නොහැකිවීම හා දෛනිකව භාණ්ඩ එහා මෙහා ප්‍රවාහනය කිරීමට සිදුවීම හා එක් පාසලක් වෙත අවම වශයෙන් දින 03 ක් එසේ කිරීමට සිදුකිරීම යන කාරණා සැලකූ විට බැලූ බැල්මට පිරිවැය අධික වීම පෙනීයන කරුණක් බැවින් විශේෂයෙන් විශ්ලේෂණයක් සිදුකර නැත.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) මෙම කඩදාසි සඳහා නිෂ්කාශන ක්‍රියාවලිය සිදු කිරීමේදී ප්‍රමාද ගාස්තු අයවන ප්‍රමාණය පිළිබඳව කළමනාකාරිත්වය හා ප්‍රසම්පාදන කමිටුව දැනුවත් කරන ලද අතර සැපයුම්කරු ගෙන්වා සාකච්ඡා කර එම මුදල අයකර ගැනීමට සාකච්ඡා වට කිහිපයක් පැවැත්වීය. එහිදී එකඟතාවය පලකළ දිනය දක්වා සියලු වරාය ගාස්තු ගෙවීමට සැපයුම්කරු ද එකඟ වූ නමුත් සංස්ථාවේ පැවති අයහපත් මූල්‍ය දුෂ්කරතාවය නිසා කලට වේලාවට බැංකු ලේඛන නිදහස් කර ගැනීමට නොහැකි විය. එම ප්‍රමාදය සැපයුම්කරුගේ දෝෂයක් නොවන නිසා එකඟතාවයකට එළැඹී දක්වා ප්‍රමාණය සැපයුම්කරුගෙන් ද ඉතිරි ප්‍රමාණය සංස්ථාවේ ප්‍රමාදය නිසා සිදු වූ බැවින් සංස්ථාව විසින්ද දැරිය. මෙකී සියලු විස්තර ප්‍රසම්පාදන කමිටුවේ දැනුවත් භාවය මත සිදුකර ඇත.

(ආ) කඩදාසිවල දීප්තිය 85 +/- 2 වශයෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද පිළිවිතරයන්ට වඩා ඉහළ දීප්තියක් අවම ලංසුකරුගේ කඩදාසි සාම්පල 1T1 වාර්තා අංක 1702023 මගින් ලබාදී ඇති අතර එය SGS වාර්තා අංක TAOWT00172687 මගින් ද තහවුරු වී ඇත. ඒ අනුව පෙළ පොත් 18 මගින් අඩුකරන ලද මිලියන 1.08 ක මුදල නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. අප කළ ඉල්ලීමකට අනුව දීප්තතාවය 82 +/- 2 ලෙස අඩුකිරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කමිටුව තීරණය කර ඇත. එම වාර්තාවේ පිටපතක් විගණන අධිකාරි වෙතද ඉදිරිපත් කරන ලදි.

(ඇ) පාසැල් පොත් කවර මුද්‍රණයේදී තොග වශයෙන් පැවති 230 gsm වර්ගයේ D/S Coated Art Board භාවිත කිරීම මගින් පාසැල් පෙළ පොත් කලට වේලාවට අවසන් කිරීමට හැකිවිය. ගිවිසුම අනුව 220 gsm කඩදාසි තොග දේශීය වෙළඳපොල තුළ ලබාගැනීමට නොහැකිවීම නිසා මෙහිදී ගත යුතු වඩාත් නිවැරදි හා කාලෝචිත ක්‍රමවේදය අනුගමනය කර ඇත. ද්‍රවශීලතාවය යහපත් මට්ටමක නොතිබෙන බැවින් සෑම කඩදාසි වර්ගයකම තොගයන් ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යාම කළ නොහැක.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සංස්ථාවේ අලෙවිසැල් 12 න් එක් අලෙවිසැලක් හැර අන් සියලුම අලෙවිසැල් ඉලක්කගත විකුණුම්වලින් සියයට 22 සිට 68 දක්වා පරාසයක අලෙවි ඉලක්ක සපුරාගත නොහැකිවීම.

2017 වසරේදී සංස්ථාවේ පැවති මූල්‍යමය ගැටලුවක් නිසා නිසි අවස්ථාවන්හිදී ආනයනික කඩදාසි සඳහා ණයවර ලිපි විවෘත කිරීම හා දේශීය සැපයුම්කරුවන් වෙත නියමිත කාලය තුළදී ණය මුදල් පියවීමට නොහැකිවීම මත අමුද්‍රව්‍ය කඩදාසි ආනයනය ප්‍රමාදවීම නිසා සිදුවූ නිෂ්පාදනයේ අඩාලවීම නිසා අවශ්‍ය නිෂ්පාදනය නිසි කලට සැපයීම සිදුකර ගැනීමට නොහැකිවීය. එයට අවශ්‍ය බාහිර ලිපිද්‍රව්‍ය සැපයුම් අඩාලවීම නිසා අලෙවිය වැඩියෙන් සිදුවන වසර අවසාන මාස කිහිපයේ දී හා වසරේ වෙනත් අවස්ථාවල අවශ්‍ය පොත් හා බාහිර ලිපිද්‍රව්‍ය සැපයුම සිදු කිරීමට නොහැකිවීම නිසා අලෙවි ආදායම් අහිමි වූ අතර එසේ සිදුනොවන්නට සැලකිය යුතු අලෙවිසැල් සංඛ්‍යාවක් ඉලක්ක සැපරීම හෝ ඉලක්ක ආසන්නයට ළඟාවීමේ ප්‍රවණතාවයක් ඇතිවීමට ඉඩකඩ තිබී ඇත.

4.4 ඌණ උපයෝජිත වත්කම්

සංස්ථාවේ ලිතෝ මුද්‍රණ අංශය, පොත්බැඳීම් අංශය හා උත්තල මුද්‍රණ අංශය පාසැල් පෙළ පොත් මුද්‍රණ ක්‍රියාවලිය අවසන්වීමෙන් පසු සෑම වර්ෂයකම ඉතිරි කාල පරිච්ඡේදයේ අදාළ යන්ත්‍ර ඌන උපයෝජනය වන අතර, ඉදිරියේදී නව අලෙවි විවිධාංගීකරණ පද්ධතියක් මත නිෂ්පාදන කටයුතු ප්‍රසාරණය කිරීමට බලාපොරොත්තු වේ.

4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් රාජ්‍ය සම්පත්

ඉඩම් කොටසේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන 107 සංස්ථාව වෙත ගෙවීම් කර පවරා ගැනීමට කාර්මික සංවර්ධන මණ්ඩලයට අග්‍රාමාත්‍ය කාර්යාලයේ පිහිටුවා ඇති ආර්ථික කමිටු රැස්වීමේදී තීරණයක් ගෙන ඇත. කාර්මික සංවර්ධන මණ්ඩලය එම කරුණු පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමුකර තීරණයක් ලබාගෙන එම මුදල් අප වෙත ගෙවිය යුතුය. එය ක්‍රියාත්මක කිරීම කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රමාද කර ඇත. ඒ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ලිඛිතව දැනුවත් කිරීම කර ඇත.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) සේවක අවශ්‍යතා පිළිබඳ සැලැස්ම (Cadre Assessment) 2017 වර්ෂයේ සිට සකස් කරමින් පවතින අතර අංශවල අවශ්‍යතාවය හා ආයතනික දූරාවලිය අධ්‍යයනයෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත කමිටුවක් මගින් මේ සැලැස්ම සකස් කර ඇත.

එම කාලසීමාව තුළ සභාපතිවරුන්ගේ මාරුවීම් සිදු වූ අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුද මෙම කමිටුවට ඇතුළත්ව සිටින බැවින් රැස්වී තීරණය ගැනීමේ යම් ප්‍රමාදයක් සිදුව ඇත. දැනට ඒ සඳහා වෙනත් සාමාජිකයින් පත් කළ යුතුය. කෙසේ වුවද සැලැස්ම සකසා අවසන් අදියරට පැමිණ ඇති බැවින් නව කමිටුවට ඉදිරිපත් කිරීමට හැකි බව කාරුණිකව දන්වමි.

(ආ) සමාලෝචිත වර්ෂයේ යෝජනා කර ඇති වැඩ සටහන් සංඛ්‍යාවේ වෙනසක් පැවතිය ද ප්‍රමුඛතාවය දිය යුතු හා අවස්ථානුකූලව පැන නැගුණ තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවිය. වැඩ අංශයේ නව සේවක පිරිස් අඩුවීම සහ අනුයුක්ත කළ පිරිස් අඩුවීම මෙයට හේතු වී ඇත. ප්‍රතිශතාත්මක යම් වෙනසක් පැවතියද ඊළඟ වර්ෂයේ ඒ පිළිබඳ සළකා කටයුතු කළ හැකිය.

4.7 වෙළඳපොළ කොටස

අභ්‍යාස පොත්, ප්‍රකාශන ග්‍රන්ථ හා වෙනත් වාණිජ මුද්‍රණ සම්බන්ධයෙන් තම වෙළඳ පොළ කොටස අවබෝධ කර ගැනීමට වෙලඳ පොළ සමීක්ෂණයක් සිදු නොකිරීම

අලෙවි පර්යේෂණ කාර්යය මනා දැනුමක් හා පළපුරුද්දක් ඇති අය විසින් සිදු කිරීම හරහා වඩා නිරවද්‍ය වූ අනාවරණයක් සිදු කර ගත හැක. අලෙවි පර්යේෂණ නිලධාරී තනතුර වසර ගණනාවක් තිස්සේ පුරප්පාඩුව පවතී. එම තනතුර පිරවීම සඳහා අභ්‍යන්තර පත් කිරීමක් සිදු කරන ලද අතර එසේ පත්කරන ලද නිලධාරියා විසින් ඔහුගේ දැනුමේ හා ප්‍රමාණයට වෙළඳපොළ සමීක්ෂණයක් සිදු කර තිබුණි. එමගින් තෝරාගත් නියැදියක වෙළඳපොල මිල ගණන් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ඇත.

ඉන් අනතුරුව එම නිලධාරියා සංස්ථා සේවයෙන් ඉල්ලා අස්වූ අතර අලෙවි පර්යේෂණ නිලධාරී තනතුර නැවත පුරප්පාඩු වුන නමුත් අලෙවි අංශයේ සේවක මණ්ඩලයේ කිහිපදෙනෙකු විසින් පාසල් 02 ක ළමුන්ගෙන් ගෝරාගත් නියැදි 06 ක් ගෙන SPC අභ්‍යාස පොත භාවිතය හා ඒ පිළිබඳව දැනුවත්භාවය හා කැමැත්ත පිළිබඳව සමීක්ෂණක් 2017 වර්ෂයේදී සිදුකරන ලදුව එකී වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට හා විගණන හා කළමනාකරණ කමිටුවට ද ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත් උක්ත කාණ්ඩයන් යටතේ අප සංස්ථාව විසින් අත්කරගෙන ඇති වෙළඳපොළ කොටස 5% කටත් වඩා අඩු ප්‍රමාණයක් වේ. නමුත් වෙළඳ පොළ තුළ ඇති අවස්ථාවන් පිළිබඳ අවධානය යොමු කිරීම හා එම අවස්ථාවන්, විකුණුම් විභවයන් බවට පත් කිරීමට හා අප තුළ පවතින දුර්වලතාවයන් හඳුනාගැනීමට උත්සාහ දැරීම හා එම දුර්වලතාවයන් අවම කර ගැනීමට අවශ්‍ය ප්‍රතිකර්ම යෙදීම පිළිබඳව අවධානය යොමු කිරීම අත්‍යවශයෙන් සිදුකළ යුතු වේ.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව ළඟා කරගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව අප සංස්ථාව මේ දක්වා විධිමත්ව දැනුවත් කර නොමැත.

6 ගිණුම්කරණ කටයුතු භාවය සහ යහපාලනය

6.1 ප්‍රසම්පාදනය

මෙට්‍රොපොලිටන් ආයතනයත්, ලේක් හවුස් ප්‍රින්ටර්ස් ආයතනයත් ඉදිරිපත් කර ඇති යන්ත්‍ර දෙකම ලේබල් මුද්‍රණය කළ හැකි සහ ලොතරැයිපත් මුද්‍රණය කළ හැකි ආරක්ෂිත මුද්‍රණ යන්ත්‍ර වේ. එබැවින් ලොතරැයි මුද්‍රණය සඳහා යන්ත්‍ර දෙකම සුදුසුවන බැවින් පිරිවිතර සැසඳීමක් සිදුකර නොමැත.

මෙහිදි ඉතාලියේ නිෂ්පාදනය කරන ලද යන්ත්‍රයට වඩා ඇමරිකාවේ නිෂ්පාදිත යන්ත්‍රය මිල දෙගුණයක් වීම හේතුවෙන් මිල නිර්දේශ කිරිමේදී සැලකිය යුතු බලපෑමක් සිදුකර ඇත.

2015 වර්ෂයේ සකස් කර තිබූ ශක්‍යතා ඇගයීම් වාර්තාව අන්තර්ජාලය හරහා ලබාගත් පිරිවිතර හා සසඳා සකස් කර ඇති අතර, නවීන තාක්ෂණයෙන් යුත් යන්ත්‍රයක උපරිම වේගය විනාඩියට මීටර් 230 ක් ලෙස දක්වා ඇත.

දැනට ෂඩ් වර්ණ මුද්‍රණ ඒකකයේ වේගය	= විනාඩියට මීටර් 110
VDP කැමරා ඒකකයේ උපරිම වේගය	= විනාඩියට මීටර් 65
මෙවිට පැය 8 කට මුද්‍රණය කළ හැකි ලොතරැයි ප්‍රමාණය	= 1,482,000
පැය 16 කට මුද්‍රණය වන ප්‍රමාණය (දිනකට)	= 2,964,000

මේවන විට මුද්‍රණ ඒකකයේ වේගය විනාඩියට මීටර් 110 සිට 120 දක්වාත් කැමරා ඒකකයේ වේගය වි. මීටර් 65 - 70 දක්වාත් ක්‍රමානුකූලව වර්ධනය කර ඇත.

6.2 අයවැය පාලනය

සභාපතිතුමා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයේ මාසික අයවැය සහ සත්‍ය තොරතුරු සම්බන්ධව මාසිකව විමර්ශනය කරනු ලබන අතර අයවැයගත වියදම හා සත්‍ය වියදම අතර පරතරය අඩුකර ගැනීමටත් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගීකර ගැනීමටත් කටයුතු කරනු ලැබේ.

